# පටිච්චසමුප්පාදය

## සිංහල භාෂ්‍යය

(පඤ්චම කාණ්ඩය.)

---

කතෘ :—

පණ්ඩිතාචාර්ය

වලාණේ ශ්‍රී විජයානන්ද ස්ථවිරයන් වහන්සේ

---

සම් කතෘ :-

අතිගරු ශ්‍රී සුමඞ්ගල බේරුවල

සිරිනිවාසාභිධාන

අමරපුර නිකායේ මහානායක මාහිමියාණන් වහන්සේ

---

ආවිෂ්කතෘ :—

පුණ්‍යකාමී

වලාණේ ජේ. ජේ. ප්‍රනාන්දු මහතා

---

2482

13. 5. 38.

සිල්පාලංකාර පානදුර



ජේ. ජේ. ප්‍රණාන්දු මහත්මිය වූ

## ඈන්. ඇලිස් ප්‍රණාන්දු

උත්පත්තිය,
26-5-1903

පරලොකප්‍රාප්තිය,
28-2-1928.

මේ දක්වන ලද්දේ අට විසි රූපයයි.

නාම ධර්මයක්වූ සංස්කාරයන් විස්තර කරන අවස්ථාවේදී අප විසින් දක්වන ලද්දේ කුසල් සිත් සමග යෙදෙන සංස්කාර පමණයි. නමුත් අකුසල් සිත් හා කුසලුත් අකුසලුත් නොවන සිත් සමග යෙදෙන සංස්කාරද තිබෙන බව සැලකිය යුතු.

නාම රූප දෙක පිළිබඳ දැන ගැනීමක් ඇතිකරගත් පමණින් විඤ්ඤාණය නිසා නාමරූප දෙක හටගන්නා පිළිවෙළ නොවැටහේ. එබැවින් ඒ පිළිබඳ මනා වැටහීමක් ඇතිවන පරිදි මීලඟට විස්තරයක් ලියනු ලැබේ.

විඤ්ඤාණය නිසා සමහරවිට නාමයද සමහරවිට රූපයද සමහරවිට නාම රූප දෙකමද හටගනී. ඒ අදහස අවබෝධ වන හැටියට මේ දෙශනාව කළයුතුව තිබුණේ විඤ්ඤාණ පච්චයා නාම රූප නාම රූපං කියායි.

මෙසේ දෙශනා කෙළේ නම් නාම යන්නෙන් හුදකලා නාමයද, රූප යන්නෙන් හුදකලා රූපයද, නාම රූප යන්නෙන් නාම රූප දෙකද, ගතහැකිවේ.

නමුත් එසේ දෙශනා නොකොට විඤ්ඤාණ පච්චයා නාම රූපං කියා දෙශනා කෙළේ මක්නිසාද ? යනු මෙහිදී පළමු කොට දැනගතයුතු කාරණයයි.

එසේ දෙශනා කරන ලද්දේ කීමේ පහසුව සලකාගෙනයි කීමේ පහසුව සලකාගෙන වුවත් සම්කිසි ශබ්දයක් නීතියට විරුඩව අස් නොකරනු ලැබේ. එබැවින් මේ ශබ්දය අස් කරන ලද්දේ යම් කිසි නීතියක් උඩබව සැලකිය යුතුයි. ඒ නීතිය නම් එක සමාන ශබ්ද දෙකක් හෝ ඊට වැඩි ගණනක් යම් කිසි තැනක කීමට සිදුවුව හොත් එයින් එකක් හෝ ඊට වැඩි ගණනක් අස්කොට එකක් ඉතිරි කිරීමයි.

මෙබඳු නීතියක් සර්වඥයන් වහන්සේගේ බොහෝ දෙශනා වල තිබෙන බව දුටු ව්‍යාකරණ කර්තෘ වරයෝද

සරූපානං මෙකසෙසසකිං

යනාදි වසයෙන් එය ව්‍යාකරණ නීතියක් කොට දැක්වූහ.

එබැවින් නාමරූප නාමරූපං යි කිවයුතුව තිබුණු පදය නාමරූපං යි ව්‍යවහාර කෙළේ ඉහතකී නීතිය අනුව බව සැලකිය යුතුයි.

මීලඟට දැනගත යුත්තේ එකී ක්‍රමයට නාමරූප හටගන්නේ කිනම් කිනම් ස්ථාන වලදැ? යන බවයි.

" ආකාසානඤ්චායතන — විඤ්ඤාණඤ්චායතන — ආකිඤ්චඤ්ඤායතන — නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කියා රූපය නැති බ්‍රහ්මලොක සතරක් පවතී. මේ බ්‍රහ්මලොක වල පවතින්නේ සිත පමණයි. මීට **අරූප ලොක** යයි කියති. රූපයක් නැති බැවිනි. **විඤ්ඤාණය නිසා නාමය හෙවත් වෙදනා—සඤ්ඤා සංඛාර යන තුන පමණක් හටගන්නේ** මේ බ්‍රහ්ම ලොක වලයි.

**විඤ්ඤාණයද නාමසංඛ්‍යාවට ඇතුළත් වන නමුත් මෙහිදී එය ඇතුළත් නොවන බව සැලකිය යුතුයි. නැතහොත් මහත් වූ අවුලක් ඇතිවිය හැකි බැවිනි.**

සිත නැත්තා වූ රූපය පමණක් ඇත්තාවූ බ්‍රහ්ම ලොකයක්ද තිබේ. මීට **අසඤ්ඤසත්ත** යයි කියති. සංඥවක් නැති බැවිනි. **විඤ්ඤාණය නිසා රූපය පමණක් හටගන්නේ** මේ බ්‍රහ්ම ලොකයෙහිය.

මේ බ්‍රහ්ම ලොකයෙහි රූපය හටගන්නේ විඤ්ඤාණය නිසා නම් **එහි විඤ්ඤාණය නැතිව රූපය හටගන්නේ කෙසේද?** විඤ්ඤාණය පළමු කොට හටගෙන ඒ සමගම හෝ ඊට පසුව රූපය හටගනී නම් **එහි සිතක් නැතැයි කියන්නේ කෙසේද?** යන ප්‍රශ්න ගැන මීලඟට කල්පනාකර බැලිය යුතුයි.

නාම රූප දෙදෙනාගේ හටගැනීමට හෙතුවන විඤ්ඤාණය **විපාක විඤ්ඤාණය අවිපාක විඤ්ඤාණය** කියා දෙයාකාර යකින් දක්වා තිබේ. **විපාක විඤ්ඤාණය** නම් යම් කිසි කුශල කර්‍මයක හෝ අකුශල කර්‍මයක ඵලය වසයෙන් ලැබෙන සිතයි. සත්‍වයන්ගේ උත්පත්තිය ගෙනදෙන්නාවූ සිතද කුශල කර්‍මයක හෝ අකුශල කර්‍මයක ඵලය වශයෙන් ලැබෙන සිතකි. එබැවින් ඊටද **විපාකවිඤ්ඤාණයයි කියති.** අවිපාක විඤ්ඤාණය නම් කුශල කර්‍මයක හෝ අකුශල කර්‍මයක ඵලයක් වසයෙන් ලැබෙන සිතක් නොවේ. කර්‍මය වසයෙන්ම ලැබෙන සිතකි.

ඊට අභිසංඛාර විඤ්ඤාන යයිද කියති. අසංඥ තලයෙහි හෙවත් සිතක් නැත්තාවූ බ්‍රහ්මලොකයෙහි රූපය පමණක් හට ගන්නේ මේ අභිසංඛාර විඤ්ඤාන බලයෙනි.

**නාමරූපස්ස යං හෙතු—විඤ්ඤාණං තං විධාමතං**
**විපාකම විපාකංච—යුත්තමෙව යතො ඉදං**

යනු නාමරූපයන්ගේ හට ගැනීමට හෙතු වූ විඤ්ඤාණයාගේ දෙවැදෑරුම් බව ප්‍රකාශ කරන ගාථාවකි.

"නාම රූප දෙදෙනාගේ හටගැනීමට හෙතුවූ යම් විඤ්ඤාණයක් වේද ඒ විඤ්ඤාණය විපාක විඤ්ඤාණය, අවිපාක විඤ්ඤාණය කියා දෙපරිද්දෙකින් යම් හෙයකින් අදහස් කරන ලද්දේද, එබැවින් විඤ්ඤාණ පච්චයා නාමරූපං යන මේ කිම සුදුසුමය." යනු ඒ ගාථාවේ අදහසයි.

මෙයින් අදහස් කරන්නේ විඤ්ඤාණ යනු කම් වසයෙන් හා කම් විපාක වසයෙන් ලැබෙන සිතට ව්‍යවහාර කරන පොදු නාමයක් බවයි.

නැව එලවන්නා නිසා නැව ගමන් කරයි. නැව නිසා නැව එලවන්නා ගමන් කරයි. එ සේම නාමය නිසා රූපය පවතී. රූපය නිසා නාමය පවතී. මෙය වැඩි වසයෙන් ලොකයේ පවත්නා සවභාව ධර්මයයි. එසේ ද නමුත් මීට වෙනස්වද නාමරූප දෙක පවතී රූපය නැත්තා වූ ආකාසානඤ්චායතනාදි බ්‍රහ්ම ලොකවල නාමය පමණක් පැවතීම නැවක් නැතුව නාවිකයෙකු ( කප්පිත්තෙකු ) ගමන් කිරීම මෙනි. සිතක් නැත්තාවූ අසංඥ තලයෙහි රූපය පමණක් පැවතීම නාවිකයෙක් නැතුව නැවක් ගමන් කිරීමමෙනි. මෙය ලොකයෙහි වැඩි වසයෙන් සිදු නොවන දෙයකි. එසේද නමුත් එය සිදුවීමටද බැරිකමක් නැත.

යම් කිසි නැවියෙක් සවකීය ශක්තියෙන් මූදේ පීනතොත් ඔහුට මුහුදේ යෑමට නැවක් වුවමනා නැත. එසේම යම්කිසි නැවක් වෙගයෙන් තල්ලුකර හැරියොත් ඒ නැවට මූදේ යෑමට නැවියෙක් උවමනා නැත.

නැවක් නැතුව සවකීය ශක්තියෙන් මූදේ පීනන නැවියා මෙන් සමහරවිට රූපය නැතුව නාමය පමණක් මේ සංසාර නමැති මූදේ ගමන් කරයි. හෙවත් නොනැසී පවතී. නැවියෙක්

නැතුව තල්ලු කිරීමේ වෙගයෙන් මුදේ යන නැවමෙන් සමහර විට නාමය නැතුව රූපය පමණක් මේ සංසාර නැමැති මූදේ ගමන් කරයි හෙවත් නොනැසී පවතී.

මෙකී උපමාවලින් නාමරූප දෙක ඔවුනොවුන්ගෙන් වෙන් ව පවතින ක්‍රමය සිතට ගත යුතුයි.

රූපාදි සකන්ධ පසම පවත්නා ලොකවල රූපය පිළිබඳ එක් තරා කොටසක් කර්මය නිසා හටගන්නා බව සියල්ලෝම අවිවාද යෙන් පිළිගනිති. ඒ රූප හටගැනීමට හෙතුවූ කර්මය ඒ ආත්ම භාව යෙහි හෝ ඊට ඉහත ආත්ම භාවයකදී කරන ලද්දක් විය යුතුයි.

එසේ නම් අසංඥ තලයෙහි වූ රූපද ඊට ඉහත ආත්මභාව යකදී කරන ලද කර්මයක ශක්තිය කාරණ කොට ගෙන හට ගැනී මටත් එසේ හටගත්තාට පසු නැවත නැවත කර්මජ හෙවත් කර්මයෙන් හටගත් රූප එක්වීමෙන් නො සිදී පැවතීමටත් කිසි සේත් බැරි කමක් නැත. කරුණු මෙසේ බැවින් අසංඥතලයෙහි පවත්නා රූප කර්ම යයි කියන ලද අභිසංස්කාර විඥානය නිසා හට ගන්නා බව නිසැකව දැනගත යුතුයි.

මෙසේ පවත්නා මේ නාම රූප දෙක විඥානය නිසා හට ගන්නා ක්‍රමය මීලඟට විස්තර කරනු ලැබේ.

රූප උපදින කල තනි තනිව උපදින්නේ නැතුව කොටස් කොටස් වසයෙන් උපදී. එක කොටසකට අයිති රූප උපදින්නේ එකවිටමයි. නැතිවන්නේත් එකවිටමයි. එ බැවින් සියලුමරූප කලාපවශයෙන් හෙවත් කොටස් වසයෙන් විසි එකකට බෙදනු ලැබේ.

එනම්:—

**1 චක්ඛුදසකය. 2 සොතදසකය, 3 ඝාණදසකය 4 ජිව්හා දසකය. 5 කායදසකය. 6 ඉත්ථිභාවදසකය. 7 පුම්භාවදසකය. 8 වත්ථුදසකය. 9 ජීවිතනවකය** කියාද,

**10 ශුද්ධාෂ්ටකය. 11 කායවිඤ්ඤත්තිනවකය. 12 වචීවිඤ්ඤත්තිදසකය. 13 ලඝුතාදෙකාදසකය. 14 කායවිඤ්ඤත්තිලඝුතාදිද්වාදසකය. 15 වචීවිඤ්ඤත්ති සද්දලඝුතාදිතෙරසකය** කියාද,

16 ශුද්ධාෂ්ටකය. 17 ශබ්දනවකය. 18 ලහුතාදෙකාදසකය. 19 ශබ්දලහුතාදිද්වාදසකය කියාද,

20 ශුද්ධාෂ්ටකය 21 ලහුතාදෙකාදසකය කියාද වේ,

මේ රූප කලාප අතුරෙන් චක්ඛුදසකය ආදි කොට ඇති කලාප නවය කර්මය නිසා උපදී. එබැවින් ඊට කර්මජ යයි කියති. 10 වෙනි ශුද්ධාෂ්ටකය ආදි කොට ඇති කලාප සය සිත නිසා උපදී. එබැවින් ඊට චිත්තජ යයි කියති. 16 වෙනි ශුද්ධාෂ්ටකය ආදි කොට ඇති කලාප සතර උණුසුම යයි කියන ලද ඍතුව නිසා උපදී. එබැවින් ඊට ඍතුජ යයි කියති. 20 වෙනි ශුද්ධාෂ්ටකය ආදි කොට ඇති කලාප දෙක ආහාරය නිසා උපදී. එබැවින් ඊට ආහාරජ යයි කියති.

වර්ණය-ගන්ධය-රසය-ඕජාව-පෘථිවිය-ජලය-තෙජස හෙවත් උණුසුම-වාතය යන රූප අට එකටම මිස වෙන් වෙන්ව නො පවතී. එබැවින් එය අවිනිබ්භෝගරූප නමි. චක්ෂුරදිය සමග මිශ්‍ර නොවීද පවතින බැවින් ශුද්ධාෂ්ටක යිද කියනු ලැබේ.

ජීවිතයත්, අවිනිභෝග රූපයත්, ඇසත් එකතු වූ කල චක්ඛුදසක නමි. එසේම ජීවිතයත්, අවිනිභෝග රූපයත් කණ-නැහැය-දිව-කය - ස්ත්‍රීභාවය - පුරුෂභාවය - හෘදයවස්තුව යන රූපයන් සමග එකතු වූකල සොතදසක-ඝාණදසක-ජිව්හාදසක - කායදසක - ඉත්ථිභාවදසක - පුම්භාවදසක-වත්ථුදශක- යන නම්වලින් කියවෙන්නේය. අවිනිභෝග රූපය පමණක් ජීවිතය සමග එක් වූ කල ජීවිතනවක නම් වේ.

අවිනිභෝග රූපය කායවිඤ්ඤත්තිය සමග එක්වූ කල කායවිඤ්ඤත්තිනවක යයිද, වචීවිඤ්ඤත්තිය හා ශබ්දය සමග එක්වූ කල වචීවිඤ්ඤත්තිදසක යයිද, ලහුතා - මුදුතා- කම්මඤ්ඤතා යන තුන සමග එක්වූකල ලහුතාදෙකාදසක යයිද, වචීවිඤ්ඤත්තිය- ශබ්දය- ලහුතාදි තුනය යන මොවුන් හා එක්වූ කල වචීවිඤ්ඤත්තිසද්දලහුතාදිද්වාදසක යයිද, කියති.

අවිනිභෝගරූපය ශබ්දය සමග එක්වූ කල ශබ්දනවක යයිද, ශබ්දය හා ලහුතාදි තුන සමග එක්වූ කල ශබ්දලහුතාදිද්වාදශක යයිද කියති.

මේ දක්වන ලද්දේ ඒ ඒ රූප කලාපවලට අයිතිරූප වෙන් වෙන් වසයෙන් දැනගන්නා ක්‍රමයයි.

විඤ්ඤාණය නිසා හටගන්නා රූපයන්ගේ නම් සියලු තන්හිම වෙන් වෙන් වසයෙන් දක්වීමට ගියොත් නිෂ්ප්‍රයොජන වෙහෙසක් ගන්ට සිදුවන නිසා ඒ ඒ රූපයන්ගේ කලාපනාම පමණක් මීට පසු දක්වනු ලැබේ. එබැවින් යම් තැනක කලාපනාමය පමණක් දක්වූ කල තේරුම් ගැනීම අපහසු වේනම් ඉහතකී කලාප විස්තරය බැලිය යුතුයි. එවිට තේරුම් ගැනීම පහසු වේ.

නාමයන්ගේ හට ගැනීමට හෙතුවන විඤ්ඤාණය **විපාක විඤ්ඤාණය-අවිපාක විඤ්ඤාණය** කියා දෙයාකාරබව මීට කලින් 90 වෙනි පිටේ ප්‍රකාශකර ඇත. ඒ කාරණය හොඳින් සිත්හි තබාගෙන ඒ ඒ තැනට සුදුසු පරිදි විඤ්ඤාණය යොදා ගතයුතුයි. එසේ නොවීනම් ඒ ඒ අවස්ථාවලදී මහත්වූ අවුලක වැටෙන්ට සිදුවේ.

සත්වයන්ගේ උත්පත්තිය ක්‍රමසතරකින් සිදුවේ. පක්ෂිආදි සමහර සත්වයෝ බිජු වටෙහි උපදිත්. ඔවුන්ට **අණ්ඩජ**යයි කියති. **අණ්ඩ**යනු බිජුවටට නමකි. ජයන්නෙන් අදහස් කරනු ලබන්නේ එහි උපන් බවයි.

මනුෂ්‍ය ආදි සමහර සත්වයෝ ජලාබුවෙහි හෙවත් වැදෑමසෙහි උපදිත්. ඔවුන්ට **ජලාබුජ**යයි කියති. **ජල** නම් කලලරූපයයි හෙවත් කාය- භාව- වස්තුයන දසකතුනයි. මෙය තලතෙලෙහි දමා උඩට ගත්තු එළලොම් අගක වැගිරී සිටි බිඳුවක් පමණ වේ. එබැවින් ඉතා සියුම්වන්නේය. මිනිස් ඇසට නොපෙනෙන්නේය. දිව ඇසට පෙනෙන්නේය. කර්මශක්තියෙන් හටගනී. ඒ කලල රූපය වසාගෙන සිටින නිසා **ජලාබු** යි කියනුලැබේ. **ජරායු** යනු ද මීට නමකි. “දිරීමට යණි” යනු එහි අර්ථයි. **ජල** ශබ්දය හා **අ** උපසර්ගය පූර්වකොට ඇති වූ ධාතුවෙන් ද, **ජරා** ශබ්දය උපපද කොටඇති **ඝා** ධාතුවෙන්ද **ජලාබු-ජරායු** යන වචන දෙක සෑදී තිබේ. කොයික්‍රමයෙන් සෑදුණත් මෙයින් අදහස් කරනු ලබන්නේ වැදෑමසයි. එය කලල රූපය වසාගෙන සිටී. දිරීමටද පැමිණේ. එබැවින් **ජලාබු** නොහොත් **ජරායු** නම්.

මදුරු ආදි සමහර සත්වයෝ අසුචි වල් ආදියෙහි උපදිත්. ඔවුන්ට **සංසෙදජ** යයි කියති. **සංසෙද** නම් තෙත් ගතිය ඇති ස්ථානයි.

දෙව් ආදී සමහර **සත්වයෝ** මෙකී ක්‍රම තුනටම වෙනස්ව තමන්ගේ ශරීර ප්‍රමාණය යම් තරම් වේද, ඒ තරමට **එකවරටම** සියලුම අවයව වලින් සම්පූර්ණවී උඩට පනින්නාක් මෙන් උපදිත්. ඔවුන්ට **ඖපපාතික** යයි කියති. **උපපාත** ශබ්දයෙන් පරව **ණික** ප්‍රත්‍යය යොදා උපපාත ශබ්දයේ මුල් ස්වරයවූ **උකාරයට** වෘද්ධි කිරීමෙන් හෙවත් **ඖකාරයක්** කිරීමෙන් **ඖපපාතික** යී සිද්ධ වේ. **උපපාත** ශබ්දයෙන් "උඩට පැනීම" යන අර්ථයද, **ණික** ප්‍රත්‍ය-යෙන් "ඇත්තේය" යන අර්ථයද ගෙනදේ. උකාරයට ඖකාරයවී මෙන් අමුතු අර්ථයක් නොකියවේ. එය ශබ්දධර්මයෙන්වූ වෙනසකි.

විඤ්ඤාණය නිසා නාම රූප දෙක හටගන්නා අවස්ථා දෙකකි. එකක් ප්‍රතිසන්ධි අවස්ථාවයි. අනික ප්‍රවෘත්ති අවස්ථාවයි. උපදින කාලය **ප්‍රතිසන්ධි අවස්ථා** නම්. පවත්නා කාලය හෙවත් ඉපදී මෙන් පසු කාලය **ප්‍රවෘත්ති අවස්ථා** නම්. මෙයින් ප්‍රතිසන්ධි අවස්ථාවෙහි නාමරූප දෙක හටගන්නා ක්‍රමය පළමුකොට දක්වනු ලැබේ.

**කාමලෝකයෙහි** අණ්ඩජ සත්වයන්ට හා ජලාබුජ සත්වයන්ට ප්‍රතිසන්ධි අවස්ථාවේදී වේදනා-සඤ්ඤා-සංඛාර යන නාම ධර්ම තුන හා කායදසක-භාවදසක-වත්‍ථුදසක යන රූප කලාප තුන හටගනී. එ සේ ද නමුත් නපුංසක සත්වයන්ට හටගන්නේ කායදසක-වත්‍ථුදසක යන කලාප දෙක පමණයි. භාවදසකය නොම හටගනී. ස්ත්‍රීභාවයක් හෝ පුරුෂභාවයක් ඔවුන්ට නැති හෙයිනි. නාම ධර්මවල වෙනසක් නැත්තේය. ඉත්ථිභාවදසකය ස්ත්‍රීන්ටත් පුම්භාවදසකය පුරුෂයන්ටත් වෙන් වෙන් වසයෙන් හටගන්නා බව සැලකිය යුතුයි.

සංසෙදජ සත්වයන්ට හා ඖපපාතික සත්වයන්ට චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-භාව-වත්‍ථු යන දසක සත හටගනී. සංසෙදජ සත්වයෝද ඖපපාතික සත්වයෝද සම්පූර්ණ ඉන්ද්‍රිය ඇතිව උපදිති. සංසෙදජසත්වයන්ගේ ඉන්ද්‍රිය උපන්නාට පසු වැඩෙති. ඖපපාතික සත්වයන්ගේ ඉන්ද්‍රිය නොවැඩෙති. සංසෙදජ ඖපපාතිකයන්ගේ වෙනස එය බව සැලකිය යුතුයි.

අණ්ඩජාදිවසයෙන් කාමලොකයෙහි උපදින සත්වයන්ට ඉහ තකී නාමධර්ම හා රූප ධර්ම හටගන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය හෙවත් ඒ ඒ භවයන්හි උත්පත්තිය ගෙන දෙන්නාවූ සිත නිසයි ප්‍රතිසන්ධි විඤ්ඤාණය නැතිනම් එකී නාම රූප ධර්ම එකක්වත් නොම හටගනී. එබැවින් ඒ නාම රූප ධර්ම විපාක විඤ්ඤාණය

නිසා හටගන්නා බව සැලකිය යුතුයි. රූප ලොක-අරූප ලොක දෙක්හිද එසේ මැයි. එහෙත් අසඤ්ඤ සත්තයෙහි එසේ නොවේ. ඒ ගැන 90 වෙනි පිටේ විස්තර කරන ලදී.

**රූපලොකයෙහි** නාම ධර්ම තුන හා චක්ඛු-සොත-වත්ථු යන දසක තුන හා ජීවිතනවකය හටගනී.

අරූප **ලොකයෙහි** නාම ධර්ම තුන පමණක් හටගනී.

මෙසේ සලකනවිට කාමභවයෙහි පහළම පඞක්තියෙන් කාය දසක-වත්ථු දසක යන රූප කලාප දෙක සමග නාම ධර්ම තුන හටගන්නා බව පෙනේ. ඒ හටගන්නේ අණ්ඩජවසයෙන් හා ජලාබුජ වසයෙන් උපදින නපුංසක සත්වයන්ටය. ඒ රූප කලාප දෙකේ පවත්නා රූප විස්සත් සමග නාම ධර්ම තුන එකතු කොට ගත් කල නාමරූප ධර්ම විසිතුනකි. රූප කලාප දෙකේ සමානව පවත්නා රූපවලින් ජීවිතය-වර්ණය-ගන්ධය-රසය-ඔජාව-පෘථිවිය - ජලය - උෂ්ණුසුම - වාතය යන නවය අත්හැර ඉතිරි රූප ගත් කල්හි නාම රූප ධර්ම දසසතරකි. මේ දක්වන ලද්දේ කාමභවයෙහි ප්‍රතිසන්ධි අවස්ථාවේදී විඤ්ඤාණය නිසා පහළවන නාමරූප ධර්මයන්ගේ අඩුම ගණනයි.

භාව දසකයත් සමග උපදින සත්වයන්ට නාම රූප ධර්ම තිස් තුනක් පහළ වේ. භාව දසකයත් සමග උපදිනම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් වේ. එකල්හිද සමානව පවත්නා රූපවලින් දසඅටක් අත්හැර ඉතිරි රූප ගත් කල්හි නාමරූපධර්ම පසළොසකි.

සංසෙදජ වසයෙන් හා ඔපපාතික වසයෙන් ඇස්-කන්-නාසාදියෙන් සම්පූර්ණව භාවයත් සමග කාමභවයෙහි උපදින කල්හි චක්ඛු - සොත - ඝාණ-ජිව්හා-කාය-වත්ථු යන දසකසක පහළ වේ. එවිට රූපධර්ම්ම සැත්තෑවකි. ඊට නාම ධර්ම තුනත් එකතු කළ විට සියලුම නාමරූපධර්ම සැත්තෑ තුනකි. මේ දක්වන ලද්දේ කාමභවයෙහි ප්‍රතිසන්ධි අවස්ථාවේදී උසස්ම පඞක්තියෙන් පහළවන නාමරූප ගණනයි. මෙහිද සමානව පවත්නා රූපවලින් පනස් හතරක් අත්හැර ඉතිරි රූප දහසයත් නාම ධර්ම තුනත් එකතුකොට ගත්කල නාමරූප ධර්ම දසනවයකි.

මෙසේ සලකන විට කාමභවයෙහි සත්වයන් උපදින අවස්ථාවේදී විස්තර ක්‍රමයේ හැටියට විසිතුනය—තිස්තුනය-සැත්තෑ

එසේද නමුත් ජාත්‍යන්ධාදීන්ගේ වසයෙන් මීට වෙනස්වද නාමරූපධර්ම පහළ වන බව සැලකිය යුතුයි. අණ්ඩජ වසයෙන් හා ජලාබුජ වසයෙන් උපදින සත්වයන්ට අඩුම ගණනේ රූප කලාප දෙකක් හටගනී. ඊට වඩා අඩු ගණනක් නොම හටගන්නා බැවින් ඔවුන් පිළිබඳ වෙනසක් මෙහිදී කීමට නැත්තේය. ඒ නිසා සංසෙදජ-ඖපපාතික වසයෙන් උපදින සත්වයන් පිළිබඳ වෙනස පමණක් මෙහි දක්වනු ලැබේ.

සුගතියෙහි ඖපපාතික වසයෙන් උපදින සත්වයෝ මහානුභාව සම්පන්න කුශල කර්ම බලයෙන් උපදිති. එබැවින් ඔවුන්ගේ ඉන්‍ද්‍රිය විකල බවක් සිදු නොවන්නේය. නමුත් සුගතියෙහි සංසෙදජ වසයෙන් උපදින සත්වයන්ගේ ඉන්‍ද්‍රිය විකල බව වන්නේය. සුගතියෙහි සංසෙදජ වසයෙන් උපදින යම්කිසි සත්වයෙක් උත්පත්තියෙන්ම අන්ධයෙක් වේ නම් ඔහට චක්ඛුදසකය නොලැබෙන්නේය. ලැබෙන්නේ සොත-ඝාණ-ජිව්හා-කාය-භාව-වත්ථු යන දසක සය පමණයි. උත්පත්තියෙන්ම බිහිරෙක් වේනම් සොත දසකය නොලැබෙන්නේය. ලැබෙන්නේ චක්ඛුආදි ඉතිරි දසක සය පමණයි. උත්පත්තියෙන්ම නැහැය නැත්තෙක් වේනම් ඝාණ දසකය නොලැබෙන්නේය. ලැබෙන්නේ චක්ඛු ආදි ඉතිරි දසක සය පමණයි. උත්පත්තියෙන්ම නපුංසකයෙක් වේනම් භාව දසකය නොලැබෙන්නේය. ලැබෙන්නේ චක්ඛු ආදි ඉතිරි දසක සය පමණයි.

සුගතියෙහි උපදින ඖපපාතික සත්වයන්ගේ ඉන්‍ද්‍රිය විකල භාවයක් සිදුනොවන නමුත් ආදිකල්පික සත්වයන්ට භාවදසකය නොලැබෙන්නේය. ආදිකල්පික සත්වයෝ නම් කල්පය හට ගන්නා කල මුලින්ම උපදින සත්වයෝයි. ඔවුන්ට භාව දසකය නොලැබෙන්නේ කාමරාගය නැතිබැවිනි. ඔව්හු බ්‍රහ්මයන් වැනි වෙති. බ්‍රහ්මලොකයෙහි සිට ආවෝද වෙති.

දුගතියෙහි සංසෙදජ වසයෙන් හා ඖපපාතික වසයෙන් උපදින සත්වයන්ට සමහරවිට චක්ඛු-සොත-භාව යන දසකයෝ නොලැබෙති. සංසෙදජ සත්වයන්ට ඝාණ දසකය නොලැබේමය. ඖපපාතික සත්වයන්ට ඝාණදසකය ලැබේමය. ඝාණදසකය ලැබෙන්නාවූ සංසෙදජ සත්වයෝද, නොලැබෙන්නාවූ ඖපපාතික සත්වයෝද නැත්තාහ.

මේ කියනලද්දේ ජාත්‍යන්ධාදීන්ගේ වසයෙන් නාමරූපධර්ම අඩුවෙන් පහළවන ක්‍රමයයි.

රූප භවයෙහි ඒ ඒ සත්වයන් උපදින අවස්ථාවේදී චක්ඛු-සොත-වත්ථු යන දසක තුනද ජීවිත නවකයද නාමධර්මතුනද පහළ වේ. ඒනිසා විස්තරක්‍රමයේ හැටියට සලකතොත් නාම රූප ධර්ම සතලිස් දෙසෙකි. සංක්ෂේප ක්‍රමයේ හැටියට සලකතොත් රූපධර්ම විසිහතක් අත්හැර ගතයුතු බැවින් පසළොසකි. අසඤ්ඤසත්ත සඞ්ඛ්‍යාත රූප භවයෙහි ජීවිත නවකය හටගන්නේය. එහි විස්තර- සංක්ෂේප වසයෙන් වෙනසක් නැත්තේය.

අරූපභවයෙහි වේදනා-සඤ්ඤා-සංඛාර යන නාමධර්ම තුන පමණක් හටගනී. එහිද විස්තර- සංක්ෂේප වසයෙන් වෙනසක් නැත්තේය.

මේ දක්වන ලද්දේ කාම-රූප-අරූප යන භවතුනේ සත්වයන් උපදින අවස්ථාවේදීම විඤ්ඤාණය නිසා නාම රූප ධර්ම පහළවන ක්‍රමයයි.

මීලඟට ප්‍රවෘත්ති කාලයෙහි හෙවත් ඉපදීමෙන් පසු කාලයෙහි විඤ්ඤාණය නිසා නාම රූප ධර්ම පහළවන ක්‍රමය දක්වනු ලැබේ.

ප්‍රවෘත්ති කාලයෙහි විඤ්ඤාණය නිසා පහළවන නාම රූප ධර්ම අනූනව (99) යක් හෝ අනූහත (97) ක්වේ.
ඒ මෙසේයි:-

රූපය පවත්නා සියලු ලෝකවල ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති ක්ෂණයෙහි ඒ ප්‍රතිසන්ධි චිත්තය සමඟ පැවති උණුසුම යයි කියන ලද ඍතුව නිසා වර්ණ-ගන්ධ-රස-ඕජා-පඨවි-ජල-තෙජස් වායු යන ශුද්ධාෂ්ටකය පහළ වේ. ඍතුව නිසා හටගත් බැවින් මීට ඍතුසමුට්ඨාන යයි කියති.

ප්‍රතිසන්ධි චිත්තය රූප නූපදවයි. එය ප්‍රපාතයක වැටුණු මිනිසෙකුවැනිය. ප්‍රපාතයක වැටුණු මිනිසෙකුට අනුන්ට උදව් කිරීමට ශක්තියක් නැත්තේය. එසේම ප්‍රතිසන්ධිචිත්තයද දුර්වල නිසා රූප ඉපදවීමට ශක්තියක් නැත්තේය. ප්‍රතිසන්ධිචිත්තය දුර්වලවීමට හෙතුව තමන්ගේ වාසස්ථානයවූ හෘදය වස්තුවේ දුර්වල කමයි. හෘදය වස්තුව දුර්වල වූයේ එය හටගත් හැටියේම නිසයි. කොයිදේ වුණත් හටගත් හැටියේ දුර්වලය.

ප්‍රතිසන්ධි චිත්තයෙන් පසුව හටගන්නා භවාඞ්ග චිත්තයේ සිට චිත්ත සමුට්ඨාන ශුද්ධාෂ්ටකය පහළවේ.

කබලිඞ්කාරාහාරය හෙවත් පිඩුකොට අනුභව කරන්නාවූ ආහාරය නිසා ජීවත්වන්නාවූ සත්ත්වයන්ට මව විසින් අනුභව කරන්නාවූ ආහාර ඕජාව ශරීරයෙහි පැතිරෙන කල්හි **ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටකය** පහළ වේ.

ප්‍රතිසන්ධික්ෂණයෙන් මත්තෙහි පැවැති උණුසුම නිසා හට ගන්නා රූපයන්ගේ ගැටීම කරණ කොටගෙනද, භවාඞ්ග චිත්තය නිසා හටගන්නා රූපයන්ගේ ගැටීම කරණ කොට ගෙනද **ශබ්දනවකය** පහළවේ.

කායදසක- භාවදසක- වස්තුදසක- චක්ඛුදසක- සොත දසක- ඝාණදසක- ජිව්හාදසක- යන දසක සත කර්මය නිසා පහළවේ.

මෙකී ක්‍රමයේ හැටියට සලකා බලනවිට සෘතු- චිත්ත- ආහාර යන හෙතු නිසා හටගන්නා ශුද්ධාෂ්ටක තුන අතුරෙන් එක ශුද්ධාෂ්ටකායක්ද, සෘතු-චිත්ත යන දෙක කරණ කොට ගෙන හටගන්නා ශබ්ද නවක දෙකද, කර්ම බලයෙන් හටගන්නා කාය දසකාදි දසක සතද එකතුවූ කල රූපාවයව අනූහය (96) කි. ඒ අනූහයට වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර යන නාමධර්ම තුනක් එකතුකළ කල්හි විඤ්ඤාණය නිසා ප්‍රවෘත්තිකාලයෙහි හටගන්නා නාම රූප ධර්ම 99 ක් බව පෙනේ. ශබ්දය හටගන්නේ ඇතැම් විටකය. එබැවින් සෘතුව නිසා හටගන්නා ශබ්දයත් සිත නිසා හටගන්නා ශබ්දයත් අක්හැර ගත්කල 97 ක් බව සැලකිය යුතු.

මෙකී නාම රූප ධර්ම 99 හෝ 97 ඒ ඒ සත්ත්වයන් ඉඳීම්- සිටීම්- නිදීම්- ගමන් බිමන් කිරීම්- කෑම්, බීම්, ආදි සියලු ක්‍රියා කරනකල දිවා රෑ දෙක්හි අතරක් නොමැතිව නොකඩව ජීවිතාන්තය තෙක් හටගනී.

මෙකී රූප අතුරෙන් කර්මය නිසා හටගන්නා රූප කලාප සියල්ලට පළමුව හටගනී. එසේදනමුත් සෘතු- චිත්ත- ආහාර යන හෙතු ධර්ම නිසා හටගන්නා රූප කලාප විසින් රැකුල් නොදෙනලද්දේ වීනම් එය නොපවතී. එසේම සෘතු ආදි හෙතුධර්ම නිසා හටගන්නා රූප කලාපයෝද කර්මය නිසා හටගන්නා රූප කලාප විසින් රැකුල් නොදෙන ලද්දහුනම් නොපවතිත්.

උණලී මීටි සතරක් එකාවිට අහසින් බිමට වැටුණේ යයි සිතමු. එසේ වැටුණු උණලී මිටි සතර එකිනෙකට ආධාර

නුණොත් රුකුල් නුදුන්නොත් බිම නොවැටී නොපවතිත්. එසේද නමුත් එකිනෙකට ආධාර වුණොත් රුකුල් දුන්නොත් ඒ අන්‍යො න්‍යාධාරය කරණ කොට ගෙන බිම නොවැටී පවතිත්.

කර්මාදි හෙතුනිසා හටගත් රූප කලාප සතරද නොනැසී පවතින්නේ මේ ක්‍රමයෙනි හෙවත් අන්‍යොන්‍යාධාරයෙනි.

"විඥානය නිසා නාම රූප දෙක හටගණී" යයි කිකල **නිසා** යන්නෙහි අදහස පැහැදිලි වසයෙන් දැනගතයුතුවේ. නැති නම් ඒ කියන කාරණය හොඳ හැටි අවබොධ නොවේ. එබැවින් ඒ පිළිබඳව විස්තරයක් මීලඟට ලියනු ලැබේ.

1. **අත්තිවාරම නිසා ගේ පවතී.**
2. **හැරමිටිය නිසා මහල්ලා ගමන් කරයි.**
3. **නායක හිමියන් නිසා නිකාය දියුණුවේ.**
4. **අඳ කොරහු ඔවුනොවුන් නිසා ඇවිදිත්.**

මේ තැන්වල යෙදී තිබෙන **නිසා** යන්න රූපයෙන් එක සමාන නමුත් අර්ථයෙන් එක සමාන නොවේ.

"අත්තිවාරම නිසා ගේ පවතී" යන්නෙහි තේරුම ගහක පැවතීමට යම්සේ මූල උපකාර වේද එසේම ගෙයි පැවතීමට අත්තිවාරම උපකාරවන බවයි. "හැරමිටිය නිසා මහල්ලා ගමන් කරයි" යන්නෙහි තේරුම හැරමිටිය අල්ලාගෙන මහල්ලා ගමන් කරන බවයි. "නායක හිමියන් නිසා නිකාය දියුණු වේ" යන් නෙහි තේරුම නායක හිමියන්ගේ අධිපතිකම කරණකොට ගෙන නිකාය දියුණුවන බවයි. අඳ කොරහු ඔවුනොවුන් නිසා ඇවිදිති "යන්නෙහි තේරුම අඳ කොර දෙදෙනාගේ ඇවිදීමට ඔවුනොවුන් උපකාර වන බවයි.

මෙයින් අප විසින් පෙන්වනු ලබන්නේ ඒ ඒ භාෂාවල යෙ දෙන යම් යම් ශබ්දවලින් නොයෙක් ක්‍රමවලට අර්ථ ගැනීමට පුළුවන් බවයි.

එබැවින් "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන තන්ති යෙදී තිබෙන **පච්චය** ශබ්දයෙන් ද නොයෙක් ක්‍රම වලට අර්ථ ගත හැකිබව සැලකිය යුතුයි. එබැවින්

**1. හෙතුපච්චයො. 2. ආරම්මණපච්චයො. 3. අධිපති පච්චයො. 4 අනන්තර පච්චයො. 5 සමනන්තර පච්චයො. 6 සහජාත පච්චයො. 7 අඤ්ඤමඤ්ඤපච්චයො. 8 නිස්සයපච්ච යො. 9 උපනිස්සයපච්චයො. 10 පුරෙජාතපච්චයො. 11 පච්ඡාජාතපච්චයො. 12 ආසෙවනපච්චයො. 13 කම්මපච්ච යො. 14 විපාකපච්චයො. 15 ආහාරපච්චයො. 16 ඉන්ද්‍රිය පච්චයො. 17 ඣානපච්චයො. 18 මග්ගපච්චයො. 19 සම්ප යුත්තපච්චයො. 20 විප්පයුත්තපච්චයො. 21 අත්ථිපච්චයො 22 නත්ථිපච්චයො. 23 විගතපච්චයො. 24 අවිගතපච්චයො.**

යි පච්චය ශබ්දයෙහි අර්ථ විසි හතරක් දක්වන ලදි.

විඤ්ඤාණය නිසා හටගන්නා නාමය **මිශ්‍ර නාමය, අමිශ්‍රනාමය** කියා දෙයාකාර වේ. මිශ්‍ර නාමය නම් රූපය සමග එකට සම්බන්ධ වී පවත්නා නාමයයි. එය ස්කන්ධ පහම පවත්නා භවයෙහි වේ. **අමිශ්‍ර නාමය** නම් රූපය සමග එකට සම්බන්ධ නොවී පවත්නා නාමයයි. එය වෙදනා- සඤ්ඤා- සඞ්ඛාර-විඤ්ඤාණ යන ස්කන්ධ සතර පමණක් පවත්නා අරූපභවයෙහි වේ.

මේ දෙයාකාරවූම නාමයට විපාක විඤ්ඤාණය හෙවත් කුශල කර්මයක හෝ අකුශල කර්මයක විපාකය වසයෙන් ලැබෙන සිත **සහජාතපච්චය- අඤ්ඤමඤ්ඤපච්චය-නිස්සයපච්චය - සම්ප යුත්තපච්චය - විපාකපච්චය - ආහාරපච්චය - ඉන්ද්‍රියපච්චය- අත්ථිපච්චය-අවිගතපච්චය**-යන නව ආකාරයෙන් ප්‍රත්‍යයවන් නේය හෙවත් උපකාර වන්නේය.

හෘදය වස්තු සඞ්ඛ්‍යාත රූපයට සහජාතපච්චය-අඤ්ඤමඤ්ඤ පච්චය - නිස්සයපච්චය-විපාකපච්චය - ආහාරපච්චය - ඉන්ද්‍රිය පච්චය - විප්පයුත්තපච්චය - අත්ථිපච්චය-අවිගතපච්චය යන නව ආකාරයෙන් ප්‍රත්‍යය වන්නේය.

හෘදය වස්තු රූපය හැර ඉතිරිරූපයට ඉහතකී **අඤ්ඤමඤ්ඤ** පච්චය හැර අනිත් අට ආකාරයෙන් ප්‍රත්‍යය වන්නේය.

මේ කාරණය මෙපමණකින් හොඳ හැටි අවබෝධ නොවන නිසා ඒ ගැන තව විස්තර කරනු ලැබේ.

විඤ්ඤාණපච්චයා නාමරූපං යන්නෙන් ගතයුතු එක අදහසක් නම් විඤ්ඤාණය නිසා නාමය හටගන්නා බවයි හෙවත් කුශල කර්මයක හෝ අකුශල කර්මයක විපාකය වශයෙන් ලැබෙන සිත නිසා වේදනා-සඤ්ඤා-සංඛාර යන තුන හටගන්නා බවයි. මේ අදහස ගැන අපි මදක්දුර කරුණු විමසා බලමු. විපාකවිඤ්ඤාණය සිතකි. වේදනා-සඤ්ඤා-සඞ්ඛාර යන තුන ඒ සිතේ හට ගන්නා ගති තුනකි. එවිට විපාක විඤ්ඤාණය චිත්තය වශයෙන්ද වේදනා-සඤ්ඤා-සඞ්ඛාර යන තුන චෛතසික වශයෙන්ද සැලකිය යුතුවේ.

චිත්තය යම් වෙලාවක උපදීනම් චෛතසිකත් ඒ වෙලාවේ දීම උපදී. එසේනම් "විඤ්ඤාණය නිසා නාමය හටගන්නා බව කීම කෙසේ ගැළපේද? යනු මෙහිදී උපදින ප්‍රශ්නයයි.

මේ ප්‍රශ්නයට දියයුතු උත්තරය නම් "විඤ්ඤාණය සහජාත ප්‍රත්‍යය වීමෙන් නාමය හටගනී" යනුයි. එයින් අඟවන්නේ යම් කිසි කර්මයක විපාකය වශයෙන් ලැබෙන සිත ඒ සිත සමඟම උපදින වේදනාදි නාමධර්ම තුනට උපකාරවන බවයි.

විඤ්ඤාණය සහජාතප්‍රත්‍යය වීමෙන් නාමය හටගන්නා බව අපේ ප්‍රකෘති ඇසට නොපෙනේ. ප්‍රකෘති ඇසට නොපෙනෙන බොහෝ දේ ඥානාක්ෂියට පෙනේ. එබඳු අවස්ථාවලදී ප්‍රකෘති ඇසට පෙනෙන ලෝක ස්වභාවයක් උපමා වශයෙන් සලකානු ලැබේ. එබැවින් විඤ්ඤාණය සහජාතප්‍රත්‍යය වීමෙන් නාමය හටගන්නා බව අපේ ඥානාක්ෂියට පෙනෙන පරිදි අපි යම්කිසි ලෝක ස්වභාවයක් ගැන කල්පනා කර බලමු.

මේ ලෝකයෙහි පහනත් ඒ පහන නිසා ඇතිවන එළියත් සඳත් ඒ සඳ නිසා ඇතිවන එළියත්, ඉරත් ඒ ඉර නිසා ඇතිවන එළියත් අපට පෙනේ.

පහනත් ඒ පහන නිසා ඇතිවන එළියත් ගැන සිතනවිට මේ දෙකෙන් කොයි එක පළමු කොට හටගත්තේදැයි නිශ්චය කර ගත නොහැකි වේ. නිශ්චය කරගත හැක්කේ දෙකම එකවර හටගත් බවයි. එසේද නමුත් අප කථාකරන කල කියන්නේ පහන නිසා පහන් එළිය හටගත් බවයි. සඳ නිසා සඳ එළිය හට ගත් බවයි. ඉර නිසා ඉර එළිය හටගත් බවයි.

මෙසේ කියන්නේ පහන පළමුකොට ඇතිවී ඊට පසු පහන් එළිය හටගත් නිසා නොවේ සඳ පළමුකොට ඇතිවී ඊට පසු සඳ එළිය හටගත් නිසා නොවේ. ඉර පළමුකොට ඇතිවී ඊටපසු

ඉර එළිය හටගත් නිසා නොවේ. එසේ නම් කිනම් යුක්තියක් උඩද? ඒ වස්තු දෙකේ පැවැති ප්‍රධාන අප්‍රධාන භාවය සලකා ගෙනයි.

මෙසේ යම්කිසි ධර්මයක් තමන් සමගම එකට උපදින්නාවූ අන්‍ය ධර්මයකට උපකාර වේනම් එය සහජාතප්‍රත්‍යය වසයෙන් සැලකියයුතු.

මේ සහජාතප්‍රත්‍යය තෙම කොටස් වසයෙන් සයවැදෑරුම් වේ. එනම්:- 1 සතර අරූපසකන්ධයෝය. 2 සතරමහා භූතයෝය. 3 නාමරූප දෙකය. 4 චිත්තචෛතසික හා චිත්ත සමුට්ඨාන රූපයෝය. 5 මහාභූත හා උපාදා රූපයෝය. 6 රූපී ධර්ම හා අරූපී ධර්මයෝය යන මොංහු වෙති.

සතර අරූපසකන්ධයෝ නම් වෙදනා- සඤ්ඤ-සඞ්ඛාර-විඤ්ඤාණ යන සතරයි. මෙකී සතර අතුරෙන් වෙදනාවගේ ඉපදීම සඤ්ඤ- සඞ්ඛාර- විඤ්ඤාණ යන තුනේ ඉපදීමට උපකාර වේ. සංඥුවගේ ඉපදීම වෙදනා-සඞ්ඛාර-විඤ්ඤාණ යන තුනේ ඉපදීමට උපකාර වේ. සංසකාරයාගේ ඉපදීම් වෙදනා- සඤ්ඤා-විඤ්ඤාණ යන තුනේ ඉපදීමට උපකාර වේ. විඤ්ඤාණයාගේ ඉපදීම වෙදනා- සඤ්ඤා- සඞ්ඛාර යන තුනේ ඉපදීමට උපකාර වේ.

සතරමහා භූතයෝ නම් පොළොව- ජලය- ගින්න- සුළඟ යන සතරයි. ඉහතකී වෙදනාදි සතර ධර්මයන්ගේ ඉපදීම මෙන්ම මේ සතරමහා භූතයන්ගේ ඉපදීමද ඔවුනොවුන්ගේ ඉපදීමට උපකාර වේ.

නාම රූප දෙක නම් වෙදනා- සඤ්ඤා-සඞ්ඛාර- විඤ්ඤාණ යන සතර හා රූපයයි. හෙවත් ප්‍රතිසන්ධි කාලයෙහි හටගන්නා චක්ඛු දසකාදියයි. මේ සතර ධර්මයන්ගේ ඉපදීමද ඔවුනොවුන්ගේ ඉපදීමට උපකාර වේ.

චිත්තචෛතසික හා චිත්ත සමුට්ඨාන රූපයෝනම් සිතත් සිතේ හටගන්නා ගතිත් සිත නිසා හටගන්නා රූපත් යන මොංහුයි. චිත්ත චෛතසිකයන්ගේ ඉපදීම චිත්තජ රූපයන්ගේ ඉපදීමට උපකාරවේ.

මහා භූත හා උපාදා රූපයෝ නම් පොළොව ආදි කොට ඇති සතර හා ඇස්- කන්- නාසාදි සූවිසි රූපයෝයි. මහා භූතයන්ගේ ඉපදීම උපාදාරූපයන්ගේ ඉපදීමට උපකාරවේ.

රූපී ධර්‍ම හා අරූපී ධර්‍මයෝ නම් හෘදය වස්තුව හා හෘදය වස්තුව සමග හටගන්නා වේදනා- සඤ්ඤා- සඞ්ඛාර- විඤ්ඤාණ යන සතරයි. මොවුන්ගේ ඉපදීමද ඔවුනොවුන්ගේ ඉපදීමට උපකාරවේ.

මෙසේ සහජාතප්‍රත්‍යය පිළිබඳ සය වැදෑරුම් කොටස්වල හෙදය දැනගත යුතුයි. මෙකී කොටස් අතුරෙන් පටිච්ච සමුප්පාද යෙහි දක්වන ලද්දේ නාම රූප දෙකයි.

**විඤ්ඤාණය අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වීමෙන් ද නාමය හටගනී.** මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණය නාමයටත් නාමය විඤ්ඤාණයටත් උපකාරවීමෙන් හටගන්නා බවයි.

යම්කිසි ධර්‍මකෙනෙක් ඔවුනොවුන්ගේ ඉපදීමට උපකාර වෙත්නම් ඔව්හු අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වසයෙන් සලකනු ලැබෙත්. ලී කැබැලි කීපයක් එකිනෙකට උපකාරවන පරිද්දෙන් තැබූ කල ඒ ලී කැබැලි කීපයම නොවැටී පවතිත්. ඒ ලී කැබැලි කීපය නොවැටී පැවතීමට ඒ ලී කැබැලි කීපයම එකසේ උපකාර වෙත්.

එසේම නාමයාගේ ඉපදීමට විඤ්ඤාණයත් විඤ්ඤාණයාගේ ඉපදීමට නාමයත් උපකාර වේ. විඤ්ඤාණය අන්‍යෝන්‍යප්‍රත්‍යය වීමෙන් නාමය හටගන්නා බව ප්‍රකාශ කෙළේ ඒ නිසයි.

1 සතර අරූපස්කන්ධයෝය. 2 සතර මහා භූතයෝය. 3 නාම රූප දෙකය කියා අන්‍යෝන්‍ය ප්‍රත්‍යය තෙම තුන්වැදෑරුම් වන්නේය. සහජාතප්‍රත්‍යයෙහි කී ක්‍රමයෙන්ම එහි විස්තරය දැනගත යුතුයි.

එකට හටගැනීමෙන් උපකාරවන ධර්‍මය **සහජාතප්‍රත්‍යය** නම් වේ. එකට හටගැනීමෙන් සහ එකට එක රුකුල්දීමෙන් උපකාරවන ධර්‍මය **අන්‍යෝන්‍යප්‍රත්‍යය** නම් වේ. සහජාතප්‍රත්‍යය වසයෙන් දැක්වූ සමහර ධර්‍මයන්හි එකට එක රුකුල්දීම් වසයෙන් උපකාරවන ගතියද ඇත්තේය. සමහර ධර්‍මයන්හි නැත්තේය. චිත්තචෛතසික නිසා හටගන්නා රූපධර්‍මයන් ගැන කල්පනා කර බලනු. චිත්තචෛතසිකධර්‍ම චිත්තජ රූපවලට උපකාරවනු මිස චිත්තජරූප චිත්තචෛතසිකධර්‍මවලට උපකාර නොවේ. උපකාර වේ නම් චිත්තජරූප පවතිනතුරු චිත්තචෛතසිකධර්‍මත් පැවතියයුතුයි. නුමුත් එසේ නොපවතී. ඊට හෙතුව ඔවුන්ගේ අන්‍යෝන්‍යප්‍රත්‍යය හෙවත් එකට එක රුකුල්දෙන ගතිය නැතිවීමයි. සහජාත ප්‍රත්‍යයාගේ වෙනස මෙකී ක්‍රමයෙන් දැනගත යුතු.

විඤ්ඤාණය නිශ්‍රයප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී. මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණය ආධාර කරගෙන නොහොත් ආශ්‍රය කරගෙන නාමය හටගන්නා බවයි.

යම්කිසි ධර්‍මයක් අන්‍යධර්‍මයක හටගැනීමට ආධාර වේනම් නොහොත් යම්කිසි ධර්‍මයක් ආශ්‍රය කරගෙන අන්‍යධර්‍මයක් හට ගනීනම් ඒ ආධාරවූ නොහොත් ආශ්‍රය කරගන්නා ලද ධර්‍මය නිශ්‍රයප්‍රත්‍යය නම් වේ.

{ පොළොව නිසා ගස වැවේ.
සැළිය නිසා බත පිසේ.

{ රෙද්ද නිසා සිතියම අඳියි.
ගල්ලෑල්ල නිසා අකුරු ලියයි.

යන කියුම් ගැන සිතා බලනු. "පොළොව නිසා ගස වැවේ"යි කී කල පොළොව ආධාර කරගෙන ගස වැවෙන බව වැටහේ. "සැළිය නිසා බත පිසේ"යි කී කලද සැළිය ආධාර කරගෙන බත පිසෙන බව වැටහේ. "රෙද්ද නිසා සිතියම අඳියි" කී කල රෙද්ද ආශ්‍රය කරගෙන සිතියම අඳින බව වැටහේ. "ගල්ලෑල්ල නිසා අකුරු ලියයි" කී කලද ගල්ලෑල්ල ආශ්‍රය කරගෙන අකුරු ලියන බව වැටහේ.

එසේම "විඤ්ඤාණය නිශ්‍රයප්‍රත්‍යය වීමෙන් නාමය හටගනී"යි කීකල ගස වැවීමට පොළොව් ආධාර වන්නාක් මෙන් බත පිසීමට සැළිය ආධාර වන්නාක් මෙන් සිතියම ඇඳීමට රෙද්ද ආශ්‍රය වන්නාක් මෙන් අකුරු ලිවීමට ගල්ලෑල්ල ආශ්‍රය වන්නාක් මෙන් විඤ්ඤාණය ආධාරකරගෙන නොහොත් ආශ්‍රය කරගෙන නාමය හටගන්නා බව වැටහේ. එසේ වැටහෙන්නේ නිශ්‍රය ප්‍රත්‍යය බල යෙණි. ආධාර– ආශ්‍රය යන දෙකේ වෙනස "පොළොවෙහි ගස වැවේ" යනාදී උදාහරණ බලා දැනගත යුතුයි.

සහජාතප්‍රත්‍යයෙහි මෙන්ම නිශ්‍රයප්‍රත්‍යයෙහිද කොටස් සයක් ඇත්තේය. ඉන් සවෙනි කොටස නම් රූපී ධර්‍ම හා අරූපී ධර්‍මයි. සහජාතප්‍රත්‍යයෙහි දැක්වූ රූපී අරූපී ධර්‍මවලට වඩා නිශ්‍රය ප්‍රත්‍යයෙහි දැක්වියයුතු රූපී අරූපී ධර්‍ම වෙනස් වේ. එය පහත සඳහන් ක්‍රමයෙන් සැලකිය යුතුයි.

ඇසනිසා චක්ඛුවිඤ්ඤාණ ධාතුවත් ඒ චක්ඛුවිඤ්ඤාණධාතුව සමග යෙදෙන චෛතසික ධර්‍මත් හටගනී. කණ නිසා සොත විඤ්ඤාණ ධාතුවත් ඒ සොතවිඤ්ඤාණ ධාතුව සමග යෙදෙන

චෛතසික ධර්මත් හටගනී. නාසිකාව නිසා ඝ්‍රාණවිඤ්ඤාණ ධාතුවත් ඒ ඝ්‍රාණවිඤ්ඤාණ ධාතුව සමග යෙදෙන චෛතසික ධර්මත් හටගනී. දිව නිසා ජිව්හාවිඤ්ඤාණ ධාතුවත් ඒ ජිව්හාවිඤ්ඤාණ ධාතුව සමග යෙදෙන චෛතසික ධර්මත් හටගනී. ශරීරය නිසා කායවිඤ්ඤාණ ධාතුවත් ඒ කායවිඤ්ඤාණ ධාතුව සමග යෙදෙන චෛතසික ධර්මත් හටගනී. හෘදයවස්තුව නිසා පඤ්චද්වාරාවර්ජනාදිය හටගනී. චක්ඛුවිඤ්ඤාණධාතුව නම් ඇස නිසා හටගන්නා සිතයි. සොතවිඤ්ඤාණාදියද එකී ක්‍රමයෙන් දතගත යුතුයි. පඤ්චද්වාරාවර්ජනය නම් ඇස්-කන්-නාසාදියෙහි ගැටුණු අරමුණ ගැන සලකන සිතයි.

ඇස රූපධර්මයකි. ඇස නිසා හටගන්නා චිත්තචෛතසික අරූපධර්මයි. රූපධර්මයක්වූ ඇස අරූපධර්මවූ චිත්තචෛතසික ධර්මයන්ගේ හටගැනීමට උපකාර වේ. ඒ උපකාර වන ක්‍රම නානා ප්‍රකාරවේ. ඒ ක්‍රම අතුරෙන් ගස වැවීමට පොළොව ආධාර වන්නාක් මෙන් නොහොත් සිතියම ඇඳීමට රෙද්ද ආශ්‍රය වන්නාක් මෙන් උපකාර වන්නාවූ ක්‍රමය නිශ්‍රප්‍රත්‍යය නමි.

සහජාතප්‍රත්‍යයෙහිදී රූපිධර්ම හා අරූපිධර්ම වසයෙන් දක්වූයේ හෘදයවස්තුව සහ වේදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන සතරයි. නිශ්‍රය ප්‍රත්‍යයෙහිදී රූපීධර්ම හා අරූපිධර්ම වසයෙන් දක්වූයේ ඇස්- කන්- නාසාදිය සහ ඒ ඇස්- කන්- නාසාදිය නිසා හටගන්නා චිත්ත චෛතසික ධර්මයි. ප්‍රත්‍යය දෙකේ සවෙනි කොටස පිළිබඳ වෙනස එයින් තේරුම්ගත යුතුයි.

**විඤ්ඤාණය සම්ප්‍රයුක්තප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී.** මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණයාගේ සහ නාමයාගේ හටගැනීම සිදුවන්නේ එකම සථානයක බවත්, ඒ දෙකේම අරමුණ එකක් බවත්; ඒ දෙකම එකවර උපදන බවත්, ඒ දෙකම එකවර නිරුද්ධවන බවත්, ඒ එකම සථානයක ඉපදීම් ආදිය නිසා විඤ්ඤාණය නාමයට උපකාරවන බවත්ය.

යම්කිසි ධර්මකෙනෙක් එකම සථානයක උපදිත් නම් එකම අරමුණක් ගනිත්නම් එකවරම උපදිත්නම් එකවරම නිරුද්ධ හෙවත් විනාශ වෙත් නම් ඒ ධර්මයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වසයෙන් සලකනු ලැබෙත්.

එකම සථානයක ඉපදීමය, එකම අරමුණක් ගැනීමය, එකවරම ඉපදීමය, එකවරම නැතිවීමය යන කරුණු සතරම සම්පූර්ණවූ කල සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වේ. සං - ප්‍ර යන උපසර්ගයන්ගෙන්

අභවන්නේ "එකී කරුණු සතර මනාව එක්වූ කල" යන අර්‍ථයයි. මෙකී කරුණු සතරින් එකක්වත් අඩුපාඩුවීනම් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය නොවේ. එය පහත සඳහන් කරන කරුණුවලින් දැන ගත හැකි වේ.

එකම ස්ථානයක ඉපදීමෙන් පමණක් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වේ නම් මහා භූතයෝද සම්ප්‍රයුක්තප්‍රත්‍යය වසයෙන් සැලකිය යුතු වෙත්.

පස්වල වතුර-ගින්දර-හුලඟ යන ධාතු තුන පවතී. නුමුත් ඒ බව අපට නොදැනෙන්නේ පස්වල පඨවි ධාතුව හෙවත් තදගතිය අධික නිසයි. වතුරෙහිද පස්-ගින්දර-හුලඟ යන ධාතු තුන පවතී. වතුරෙහි ආපො ධාතුව හෙවත් දියාරු ගතිය අධික නිසා ඒ බවද අපට නොදැනේ. ගින්දරෙහිද පස්-වතුර-හුලඟ යන ධාතු තුන පවතී හුලඟෙහිද පස්-වතුර-ගින්දර යන ධාතු තුන පවතී. නුමුත් ගින්දරෙහි තෙජො ධාතුව හෙවත් උණුසුම් ගතියත් හුලඟෙහි වායො ධාතුව හෙවත් පුම්බන ගතියත් අධික නිසා ගින්දර- හුලඟ යන දෙකේ අනිත් ධාතු පවතින බව අපට නොදැනේ.

මෙසේ සලකන විට ඉහත කී එක් එක් ධාතුවක අනික්අනික් ධාතු තුනම පවතින බව පෙනේ. ඒ නිසා ඒ එක එක ධාතුවක් අනික් අනික් ධාතු තුනේ හට ගැනීමට හා පැවතීමට ආධාර ස්ථානය වේ. එවිට අනික් අනික් ධාතු තුන එකම ආධාරස්ථානයක හටගත් බැවින් හා පවත්නා බැවින් එකවසතුක වේ. එ බැවින් එක වසතුක භාවය හෙවත් එකම ස්ථානයක හටගැනීම පමණක් සම්ප්‍ර යුක්ත ප්‍රත්‍යයෙහි ලක්‍ෂණ වසයෙන් දක්වන ලද්දේ නම් මහා භූතයෝද සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වසයෙන් සැලකිය යුතු වෙත්. එකාරම්මණ භාවයත් හෙවත් එකම අරමුණක් ගැනීමත් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ලක්‍ෂණයක් වසයෙන් දක්වන ලද්දේ ඒනිසයි. එයින් අදහස් කරන්නේ එකම ස්ථානයක ඉපදීමෙන් පමණක් සම්ප්‍ර යුක්ත ප්‍රත්‍යය නොවන බවයි.

එකවසතුක භාවය සහ එකාරම්මණ භාවය පමණක් සම්ප්‍ර යුක්ත ප්‍රත්‍යයෙහි ලක්‍ෂණ වසයෙන් දක්වන ලද්දේ නම් චුති චිත්තය සමීපයෙහි වූ සමපටිච්ඡන හෙවත් අරමුණු පිළිගන්නා සිත් ආදියද සම්ප්‍රයුක්තප්‍රත්‍යය වසයෙන් සැලකිය යුතුවේ. සමපටිච්ඡන චිත්තාදිය උපදින්නේත් එකම ස්ථානයකය හෙවත් හෘදය වසතුවේය. ඒසිත්වල අරමුණත් එකක්මය හෙවත් කාමාදි නිමිත්ය. මෙසේ සලකන විට එක වසතුක භාවය සහ එකාරම්මණ

භාවය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ලක්‍ෂණ නොවන නිසා එකුප්පාද භාවයත් හෙවත් එක වරම ඉපදීමත් එහි ලක්‍ෂණයක් වසයෙන් දක්වන ලදි. එකවර ඉපදීමක් සම්පටිච්ඡන චිත්තාදීන්ට නැත් තේය. සම්පටිච්ඡන චිත්තය උපන්නාට පසු සන්තීරණ චිත්තය උපදී. සන්තීරණ චිත්තය උපන්නාට පසු වොත්‍ථපන චිත්තය උපදී.

එක වත්‍ථුකභාවය- එකාරම්මණ භාවය- එකුප්පාද භාවය යන ලක්‍ෂණ තුන යම් ධර්මයන් තුළ පවතී නම් ඒ ධර්මයෝ එක නිරොධ හෙවත් එකවරම නැතිවීම් ලක්‍ෂණයෙන් යුක්තාවෙති. භින්න නිරොධ හෙවත් වෙන වෙනම නැතිවන්නාහු නොවෙති. එබැවින් ඒ ගැන විශෙෂයෙන් කිව යුත්තක් නැත්තේය.

විඤ්ඤාණය සහ නාමය උපදින්නේත් එකම ස්‍ථානයකය. ඒ දෙකට අරමුණුවන්නේත් එකම කාරුණක්මය. ඒ දෙක උප දින්නේත් එකවරමය. මෙකී ලක්‍ෂණ තුනෙන් යුක්තබැවින් නිරුද්ධවීමත් එකවරමය. එබැවින් "විඤ්ඤාණය නිසා නාමය හටගනී" යන්නෙහි විඤ්ඤාණය පිළිබඳ සම්ප්‍රයුක්තභාවය යෙදේ.

සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය පිළිබඳ එකවත්‍ථුකභාවය අරූපභවයෙහි නොලැබෙන්නේස. එහි රූපයක් නැතිබැවිනි.

විඤ්ඤාණය විපාක ප්‍රත්‍යයවීමෙන්ද නාමය හටගනී. මෙහි අදහස වසයෙන් ගතයුත්තේ උත්‍සාහරහිතව ක්‍රියාරහිතව සන් සුන්ව පවත්නා සිතනිසාත් නාමය හටගන්නා බවයි. උත්සාහ රහිතව ක්‍රියා රහිතව සංසුන්ව පවත්නා සිතනම් කුශලකර්මයක හෝ අකුශල කර්මයක ප්‍රතිඵලය වසයෙන් උපදින සිතයි. එනම් ප්‍රතිසන්‍ධි චිත්තාදියයි. සන්සුන්ව පැවතීම නම් වැඩක් නැතිව විවෙකව නිවාඩුපිට ඉඳීමයි. කෙලෙසුන්ගෙන් සංසිඳීමක් නොවේ. කර්මයවසයෙන් උපදින්නේ උත්සාහ සහිතවූ ක්‍රියා සහිත වූ නො සන් සුන් වූ සිතයි.

සංසුන්ව පවත්නා සිත් අතුරෙන් ප්‍රතිසන්‍ධිචිත්තය එක්තරා එකකි. එබැවින් ඒ ප්‍රතිසන්‍ධි චිත්තය හටගන්නා අවස්‍ථාවෙහි උපදින වෙදනා-සඤ්ඤා-සංඛාර යන නාමධර්මයෝ විපාක ප්‍රත්‍ය යෙන් හටගන්නා නාම ධර්මලෙස සැලකිය යුත්තාහ. විඤ්ඤාණය විපාක ප්‍රත්‍යය වී මෙන් ද නාමය හටගන්නා බව කීයේ ඒ නිසයි.

විඤ්ඤාණය ආහාර ප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී. මෙහි අදහස වසයෙන් ගත යුත්තේ යම්සේ ඒ ඒ සත්‍වයන් විසින් අනුභව කරන ආහාරය රූපයට රුකුල් දේද එසේම විඤ්ඤාණයද නාමයට රුකුල් දෙන බවයි.

කබලිඞ්කා රාහාරය- ඵස්සාහාරය - මනොසංචෙතනාහාරය- විඤ්ඤාණාහාරය කියා ආහාරය සිව්වැදෑරුම් වන්නේය. සාමාන්‍ය යෙන් ඒ ඒ සත්‍වයන් විසින් අනුභව කරන කෑම බීමාදිය **කබලි ඞ්කාරාහාර** නම් වේ.

ඇස්-කන්- නාසාදියත්, ඒ ඇස්- කන්- නාසාදියට හමුව න රූප-ශබ්ද-ගන්‍ධා දියත්, ඒ දෙපක්‍ෂය නිසා හට ගන්නා සිතත් යන තිදෙනාගේ එක්වීම **ඵස්සාහාර** නම් වේ.

ඒ ඒ සත්‍වයන් විසින් රැස් කර ගන්නා කුශලා .කුශල චෙතනා හෙවත් කර්මය **මනොසඤ්චෙතනාහාර** නම් වේ.

ඒ ඒ කුශලාකුශලචෙතනා නිසා හටගන්නා **ප්‍රතිසන්‍ධි** විඤ්ඤාණාදිය හෙවත් විපාකය **විඤ්ඤාණාහාර** නම් වේ.

මෙකී කබලිඞ්කාරාහාරාදි සිව් වැදෑරුම් ආහාරයට නාම රූප ධර්මයන් ආහරණය කරන නිසා හෙවත් උපදවන නිසා **ආහාර** යයි කියනු ලැබේ.

කබලිඞ්කාරාහාරයතෙම මුඛයෙහි තැබූකල්හිම රූප උපදවයි. දත් වලින් විකා අනුභව කරන කල එක එක බත් ඇටයක් පාසා රූප උපදවයි. ස්පර්ශය තෙම සැප වෙදනාද, දුක් වෙදනාද මැදහත් වෙදනාද ඒ ඒ අවස්ථාවට ගැලපෙන පරිදි උපදවයි. මනොසඤ්චෙතනාහාරය තෙම කාමභවය- රූපභවය- අරූප භවය යන භවත්‍රය උපදවයි. විඤ්ඤාණාහාරය තෙම නාම රූප ධර්ම උපදවයි.

මෙකී ආහාර සතර රූපාහාරය, නාමාහාරය කියා දෙයාකාර යකට බෙදන්නේය. කබලිඞ්කාරාහාරය තෙම රූපාහාර නම්. ද්‍රව්‍යයක් බැවිනි. ඵස්සාහාර- මනොසඤ්චෙතනාහාර- විඤ්ඤාණා හාර යන තුන **නාමාහාර** නම්. අද්‍රව්‍යයක් බැවිනි.

මේ දෙවැදෑරුම් ආහාරයාගේම ජනකත්‍වය- උපස්තම්භකත්‍වය කියා ගති දෙකක් පවතී. ජනකත්‍වය නම් රූපාරූපධර්ම උපදවන බවයි. උපස්තම්භකත්‍වය නම් රූපාරූපධර්මයන්ට රුකුල්දෙන බවයි. මේ ගති දෙක අතුරෙන් ජනකත්‍වයට වඩා උපස්තම්භ කත්‍වය ප්‍රධාන වසයෙන් සලකනු ලැබේ.

ඊට හෙතුව මෙසේයි:—

කබලිඞ්කාරාහාරයයි කියනලද රූපාහාරය තෙම යම්කිසි රූප යක් උපදවා නම් ඒ රූපයට රුකුල්දීමද කරන්නේය. ඉපදවීම පමණක් කොට නොනවතින්නේය. එසේම ඵස්සාහාර- මනො

සඞ්ඛතතාහාර- විඤ්ඤාණාහාර යයි කියන ලද නාමාහාරයද තම තමන් විසින් උපදවනු ලබන නාමරූපයන්ට රුකුල්දීමද කරන්නේය. ඉපදවීම පමණක් කොට නොනවතින්නේය.

කර්‍ම-චිත්ත-ඍතු-ආහාර කියා රූපයන්ගේ ඉපදීමට හෙතු සතරක් පවතී. මේ හෙතු සතර අතුරෙන් එක් හෙතුවක්නිසා හටගන්නා රූපයෝ එකජ හෙවත් එකසමුට්ඨාන නම් වෙත්. හෙතු දෙකක් නිසා හටගන්නා රූපයෝ ද්විජ හෙවත් ද්විසමුට්ඨාන නම් වෙත්. හෙතු තුනක් නිසා හටගන්නා රූපයෝ ත්‍රිජ හෙවත් ත්‍රිසමුට්ඨාන නම් වෙත්. හෙතු සතරම නිසා හටගන්නා රූපයෝ චතුජ හෙවත් චතුසමුට්ඨාන නම් වෙත්.

යම් කිසි රූපයක් ආහාරය සහ අතිකුත් හෙතු නිසා උපදී නම් ඒ රූපයට ආහාරය රුකුල්දීමෙන් පමණක් උපකාර වන්නේය. එයින් හැඟෙන්නේ අතිත් හෙතු නිසා ආහාරයාගේ ජනක භාවය නැතිවීගියත් උපස්ථම්භක භාවය හෙවත් රුකුල් දෙන බව නැති නොවන බවයි. ජනක භාවයට වඩා උපස්ථම්භක භාවය ප්‍රධාන බව එයින් ද වැටහේ.

ඉදින් රූපාහාරයේ උපස්ථම්භකත්වය නැත්තේ වී නම් ජනකත්වය හෙවත් උපදවන බව නැත්තේමය. එයින් ද හැඟෙන්නේ උපස්ථම්භකත්වය ප්‍රධාන බවයි.

විඤ්ඤාණය ඉන්ද්‍රියප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී. මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණය ප්‍රධාන භාවයෙහි සිට ගෙන අන්‍යධර්‍මයන්ගේ ප්‍රධානත්වය නැති නොකොට නාමයට උපකාර කරන බවයි.

යම්කිසිධර්‍මයක් අන්‍යධර්‍මයන්ගේ ප්‍රධානභාවය නොවළක්වා නොමැඩ පවත්වා සවකීය කටයුත්තෙහි ප්‍රධානකම කෙරේ නම් එය ඉන්ද්‍රිය ප්‍රත්‍යය නම් වේ. ඉන්ද්‍රිය යන්නෙහි අදහස ප්‍රධාන- ඊශ්වර- අධිපති යනුයි.

රූප දැකීමේදී ප්‍රධානත්වය උසුලන්නේ ඇසයි. එබැවින් ඊට චක්ඛුන්ද්‍රිය යී කියත්. ශබ්ද ඇසීමේදී ප්‍රධානත්වය උසුලන්නේ කණයි. එබැවින් ඊට සොතින්ද්‍රිය යී කියති. ගඳ දැනගැනීමේදී ප්‍රධානත්වය උසුලන්නේ නාසිකාවයි. එබැවින් ඊට ඝාණින්ද්‍රිය යී කියති රස විඳීමෙහිදී ප්‍රධානත්වය උසුලන්නේ දිවයි. එබැවින් ඊට ජිව්හින්ද්‍රිය යී කියති. මෙසේ ඒ ඒ ක්‍රියාවන්හි ප්‍රධාන භාවයෙන් ක්‍රියා කරන ධර්‍මයන් ඉන්ද්‍රිය නාමයෙන් කියවෙන බව සැලකියයුතු.

අධිපතිප්‍රත්‍යය- ඉන්ද්‍රියප්‍රත්‍යය යන දෙකේ වෙනසද මෙහිදී දැනගතයුත්තකි. යම්කිසි ධර්මයක් අන්‍යධර්මයන්ගේ ප්‍රධානත්වය වළක්වා- මැඩපවත්වා අධිපති භාවයෙන් ක්‍රියා කෙරේ නම් එය අධිපති ප්‍රත්‍යයයි. යම්කිසි ධර්මයක් අන්‍යධර්මයන්ගේ ප්‍රධානත්වය නොවළක්වා නොමැඩ පවත්වා අධිපති භාවයෙන් ක්‍රියා කෙරේ නම් එය ඉන්ද්‍රියප්‍රත්‍යයයි. මේ කාරණය තව හොඳට පැහැදිලි වසයෙන් වැටහීම පිණිස උපමාවක් දක්වනු ලැබේ.

අධිපතිප්‍රත්‍යය යම්කිසි මහ රජතුමෙකු මෙනි. ඉන්ද්‍රියප්‍රත්‍යය ඒ මහරජතුමා යටතේ එක එක ප්‍රදේශවල කටයුතු කරවන යුව රජවරුන් මෙනි. මහරජතුමා අනික් යුව රජවරුන්ගේ ප්‍රධාන කම් අධිපතිකම් වළක්වා- මැඩපවත්වා කටයුතු කරයි. එසේම අධිපතිප්‍රත්‍යයද අනික් ධර්මයන්ගේ ප්‍රධානකම් අධිපතිකම් වළක් වමින් ක්‍රියාකරයි.

අධිපතිකම් කරන ධර්මයෝ සතරදෙනෙක් වෙති. එනම්;- ඡන්ද-චිත්ත-වීරිය-වීමංසා යන මොහුයි. මේ ධර්ම සතර අතුරෙන් ඡන්දය අධිපතිකම් කරන කල අනික් ධර්මයෝ තුන්දෙනම පසුබැස සිටිති. චිත්තය අධිපතිකම් කරන කල අනික් ධර්මයෝ තුන් දෙනම පසු බැස සිටිති. විරිය- වීමංසා දෙදෙනාගේ තත්වයද එසේමය. මෙයින් අඟවන්නේ අධිපති ප්‍රත්‍යය නිතරම අන්‍යධර්ම යන්ගේ ප්‍රධානත්වය වළක්වන බවයි.

මහරජතුමා යටතේ ක්‍රියා කරන යුවරජවරු ඔවුනොවුන්ගේ ප්‍රධානකම් නොම වළක්වති. නොමැඩ පවත්වති. තමතමන්ගේ කටයුතුවල පමණක් ප්‍රධානත්වය උසුලති. එසේම ඉන්ද්‍රිය ප්‍රත්‍යයද අන්‍යධර්මයන්ගේ ප්‍රධානත්වය නොම වළක්වයි.

රූපදැකීමේදී ඇසට අයිති ප්‍රධානත්වය කණ නොම වළක්වයි. නොමැඩ පවත්වයි. ශබ්ද ඇසීමෙහිදී කණට අයිති ප්‍රධානත්වය ඇස නොමවළක්වයි. නොමැඩ පවත්වයි. අනික් ඉන්ද්‍රියයන්ගේ තත්වයද මෙසේය මෙයින් අඟවන්නේ ඉන්ද්‍රියප්‍රත්‍යය අනික් ධර්මයන්ගේ ප්‍රධානත්වය නොම වළක්වන බවයි. අධිපතිප්‍රත්‍යය- ඉන්ද්‍රියප්‍රත්‍යය යන දෙකේ වෙනස මෙකී කරුණුවලින් මනාව දැනගතහැක්කේය.

**විඤ්ඤාණය අස්තිප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී.** මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණය ඇතිකල්හි නාමය හට ගන්නා බවයි. යමක් ඇතිකල්හි යමක් හටගනීනම් එය අස්ති

ප්‍රත්‍යයයි. හිමාලය පර්වතය ඇතිකල්හි වෘක්ෂලතාවෝ වැඩෙත්. මෙහි වෘක්ෂලතාවන්ගේ වැඩීමට හෙතුවූයේ හිමාලය පර්වතය ඇති බවයි.

**විඤ්ඤාණය අවිගතප්‍රත්‍යය වීමෙන්ද නාමය හටගනී.** මෙහි අදහස වසයෙන් ගතයුත්තේ විඤ්ඤාණය හා නාමය වෙනස් නොවී පැවතීමෙන් නාමයට උපකාර වන බවයි. යම්කිසි ධර්මයක් වෙන් නොවී පැවතීමෙන් යමකට උපකාර වේනම් එය අවිගත ප්‍රත්‍යයයි. පුත්‍රයා වෙන් නොවී සිටීම නිසා මව්පියෝ ප්‍රීති වෙති. මෙහි මව්පියන්ගේ ප්‍රීතිවීමට හෙතුව පුත්‍රයාගේ වෙන් නොවීම බව පෙනේ.

මෙතෙක්දුර විස්තර කරනලද්දේ විඤ්ඤාණය නාමයට ප්‍රත්‍යය වන හෙවත් උපකාර වන ක්‍රමයයි. මේ විස්තරයෙන් කැටිකොට ගතයුතු කොට අදහස මෙසේයි.

1 විඤ්ඤාණය වෙදනා- සඤ්ඤා- සඞ්ඛාර යන නාමය සමග එකට ඉපදීමෙන් ඒ නාමයට උපකාර වන බව (සහජාතප්‍රත්‍යය) 2. විඤ්ඤාණය නාමයටත් නාමය විඤ්ඤාණයටත් උපකාර වන බව (අඤ්ඤමඤ්ඤපච්චය ) 3. විඤ්ඤාණය ආධාරකරගෙන හෙවත් විඤ්ඤාණයෙහි නාමය හටගන්න බව (නිස්සයපච්චය)4. විඤ්ඤාණ-නාම යන දෙදෙනා එකම ස්ථානයක ඉපදීම් ආදිය නිසා විඤ්ඤාණය නාමයට උපකාර වන බව (සම්ප්‍රයුක්තප්‍රත්‍යය) 5. යම්කිසි කර්මයක විපාකයක් වසයෙන් ලැබෙන සිත නිසා නාමය හටගන්නා බව (විපාකප්‍රත්‍යය) 6. විඤ්ඤාණය විසින් රුකුල් දීම් වසයෙන් නාමයට උපකාර කරන බව (ආහාරප්‍රත්‍යය) 7. විඤ්ඤාණය ප්‍රධාන භාවයෙහි සිට අන්‍යධර්මයන්ගේ අධිපතිකම් නොවළක්වා නාමයට උපකාර කරන බව (ඉන්ද්‍රියප්‍රත්‍යය) 8. විඤ්ඤාණය ඇතිකල්හි නාමය හටගන්නා බව (අස්තිප්‍රත්‍යය) 9. විඤ්ඤාණ-නාම යන දෙක වෙන් නොවී පැවතීමෙන් විඤ්ඤාණය නාමයට උපකාර කරන බව (අවිගතප්‍රත්‍යය) යන මේ කරුණු ටිකයි.

මීලඟට දතගතයුත්තේ විඤ්ඤාණය රූපයට ප්‍රත්‍යය වන ආකාරයයි.

ඉහතකී සහජාතප්‍රත්‍යයාදීන් අතුරෙන් සම්ප්‍රයුක්තප්‍රත්‍යය හැර අනික් අට ආකාරයෙන් හා විප්‍රයුක්තප්‍රත්‍යය වසයෙන් විඤ්ඤාණය වස්තු රූපයට හෙවත් හෘදයවස්තුවට උපකාර වන්නේය. සහජාතප්‍රත්‍යයාදිය කලින් විස්තර කළ නිසා විප්‍රයුක්ත ප්‍රත්‍යය ගැන පමණක් මෙහි විස්තර කරනු ලැබේ.

“විඤ්ඤාණය විප්‍රයුක්තප්‍රත්‍යය වීමෙන් රූපය හටගනී”යි කී කල එහි අදහස වශයෙන් ගතයුත්තේ එක ස්ථානයක උපදින්නේත් නැතුව එක අරමුණක යෙදෙන්නේත් නැතුව එකට උපදින්නේත් නැතුව එකට නිරුද්ධවන්නේත් නැතුව විඤ්ඤාණය හෘදයවස්තු රූපයට උපකාර වන බවයි.

අරූපීධර්ම රූපීධර්ම හා එක වස්තුකාදි ලක්‍ෂණවලින් සමාන නොවේ රූපීධර්ම අරූපීධර්ම සමඟද සමාන නොවේ. නුමුත් අරූපීධර්ම රූපීධර්මවලටත් රූපීධර්ම අරූපීධර්මවලටත් උපකාර වේ. එය විප්‍රයුක්තතාදි ප්‍රත්‍යය වශයෙනි.

විඤ්ඤාණය අන්‍යොන්‍යප්‍රත්‍යය වශයෙන් උපකාර වන්නේ හෘදයවස්තු රූපයට පමණයි. ඊට හෙතුව නම්:— විඤ්ඤාණය නැතුව හෘදයවස්තුවත් හෘදයවස්තුව නැතුව විඤ්ඤාණයත් නොම හට ගැනීමයි. අනික් රූපවලට ඒ අන්‍යොන්‍ය ප්‍රත්‍යය නොලැබෙන්නේ විඤ්ඤාණය හා ඒ රූපයන්ගේ අන්‍යොන්‍යාධාරයක් නැතුව හටගැනීම සිදුවන බැවිනි.

අභිසංස්කාර විඥනය හෙවත් කුශලාකුශල කර්ම වශයෙන් උපදින චෙතනාව අසංඥසත්ත්වතලයෙහි හා පඤ්චස්කන්ධය පවතින භවයෙහි කර්මජරූපයන්ට උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් උපකාර වන්නේය.

මෙයින් ගතයුතු අදහස නම් අභිසංස්කාරවිඥානය ඇති කල්හි එය බලවත් උපකාරයක් වීමෙන් ඉහත කී ස්ථාන දෙකේ කර්මජරූප හටගන්නා බවයි. ආශ්‍රය නම් පීඩාවයි. උපායාස නම් බලවත් පීඩාවයි. නිස්සය නම් උපකාරයයි. උපනිස්සය නම් බලවත් උපකාරයයි.

ආරම්මණූපනිස්සය – අනන්තරූපනිස්සය – පකතූපනිස්සය කියා උපනිස්සයප්‍රත්‍යය තුන්වැදෑරුම් වන්නේය. යම්කිසි අරමුණක් බලවත් ලෙස උපකාරවීම ආරම්මණූපනිස්සය නම්. දානයක් දී එය නැවත නැවත සිහි කෙරේ නම් ඒ සිහි කරන කරන අවස්ථාවලදී කුසල්සිත් උපදී. එසේම සීලයක් රැක එය නැවත නැවත සිහිකෙරේ නම් ඒ සිහි කරන කරන අවස්ථාවලදී කුසල් සිත් උපදී. භාවනාවක් කර එය නැවත නැවත සිහි කෙරේ නම් ඒ සිහි කරනකරන අවස්ථාවලදී කුසල් සිත් උපදී. මේ කුසල්සිත් ඉපදීමට හෙතුව පෙර කරනලද දාන-සීල-භාවනා යන කුශලකර්ම අරමුණුකිරීමයි. එබැවින් එය ආරම්මණූපනිස්සය වන්නේය.

පළමු පළමු උපදින සිත් පසු පසුව උපදින සිත්වලට බලවත් ලෙස උපකාරවීම අනන්තරූපනිස්සය නමි. දානයක් දෙනවිට ඇතිවන්නාවූ චිත්තවීථියෙන් මුලින් මුලින් හටගන්නාවූ සිත් පසු පසුව උපදින සිත්වලට බලවත් ලෙස උපකාර වන්නේය. එසේම සීලයක් රකින කල ඇතිවන්නාවූ චිත්තවීථියෙහි මුලින් මුලින් හටගන්නාවූ සිත් පසු පසුව උපදින්නාවූ සිත්වලට බලවත් ලෙස උපකාර වන්නේය. භාවනාවක් කරනවිටද එසේමය. අනන්ත රූපනිස්සයෙහි හෙතු–ඵල දෙදෙනාගේ අතරක්–ඉඩක්–අවකාශ යක් නැත්තේය. හෙතුව ළඟට ඵලය ලැබේ. අනන්තර යන් නෙන් අදහස්කරන්නේ එයයි. ආරම්මණූපනිස්සය එසේ නොවේ. අද දීපු දානයක් අරමුණුවීමෙන් – සිහිවීමෙන් තව සතියකට පසු වද, මසකට පසුවද, අවුරුද්දකට පසුවද, දෑවුරුද්දකට පසුවද යනාදි ක්‍රමයෙන් කුසල් සිත් උපදින්නේය. එවිට ඒ හෙතු–ඵල දෙදෙනාගේ අතරතුර තව නොයෙකුත් චෙතනා ඇතිවීමට ඉඩ තිබේ. ආරම්මණූපනිස්සය–අනන්තරූපනිස්සය යන දෙදෙනාගේ වෙනස එයින් තේරුම්ගතයුතුයි.

සවකීය බලය සිදුකරදීම පිණිස මනාසේ සකස්කරනලද බලවත් උපකාරය පකතූපනිස්සය නමි. මෙහි පකත යන්නෙන් කරනු ලබන්නේ "මනාසේ සකස්කරනලද" යන අර්ථයයි. සවකීය චිත්තයෙහි මනාකොට උපදවාගන්නාලද ශ්‍රද්ධා– ශීල–ශ්‍රැතාදි ගුණ ධර්මයෝද, මනාකොට සෙවනය කරනලද ඍතු–භොජන–විහාර–සෙනාසනාදියද පකතූපනිස්සය සඞ්ඛ්‍යාවට ඇතුළත් වේ.

යමෙක් සවකීය චිත්තයෙහි මනාකොට ඇතිකරගන්නාලද ශ්‍රද්ධාව කාරණ කොටගෙන දානයක් දේද එවිට ඒ දානයට ඒ ශ්‍රද්ධාව පකතූපනිස්සය වේ. එසේම මනාකොට ඇතිකරගන්නා ලද ශීලය කාරණකොටගෙන දානයක් දේද එවිටද ඒ දානයට ඒ ශීලය පකතූපනිස්සය වේ. ශ්‍රැතාදියද පකතූපනිස්සය වන්නේ මේ ක්‍රමයෙනි.

යමෙක් සැපවූ ඍතුවක්– භොජනයක්–විහාරයක්– සෙනාසන යක් නිසා දන්දීම් ආදිය කෙරේද ඒ දන්දීම් ආදියටද ඒ ඍතුආදිය පකතූපනිස්සය වේ. ආරම්මණූපනිස්සය– අනන්තරූපනිස්සය යන ප්‍රත්‍යය දෙක සමග මිශ්‍ර නොවී සවකීය සවභාවයෙන් උපකාර වන ධර්මයටද පකතූපනිස්සයයි කියති. එවිට එහි පදච්ඡේදය පකති + උපනිස්සය කියා වියයුතු. පකති යන්නෙන් අදහස් කරන්නේ සවභාවයයි..

මෙසේ උපනිස්සයප්‍රත්‍යය පිළිබඳ හෙදත්‍රය දතහගතයුත්තේය. මෙකී හෙදත්‍රය අතුරෙන් විඤ්ඤාණය නාමයට උපකාර වන්නේ පකතූපනිස්සය වසයෙනි.

ප්‍රතිසන්ධි විඥානය - අභිසංස්කාර විඥානය යන දෙදෙනා කෙරෙන් අන්‍යවූ සියලුම විඥානය ඒ ඒ නාමරූපයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය වන්නේය.

නාම- රූප දෙකට විඤ්ඤාණය ප්‍රත්‍යය වන ක්‍රම මෙතෙකින් අවසාන බව සැලකිය යුතුයි. ප්‍රත්‍යයන්ගේ එකිනෙකට ඇති වෙනස පැහැදිලි වසයෙන් වටහාගැනීම ඉතාම අපහසු කාරණයකි. අපහසුවෙන් නමුත් ඒ වෙනස වටහා නොගත්තොත් විඤ්ඤාණය නාම-රූප දෙකට ප්‍රත්‍යයවනපිළිවෙළ හොඳහැටි අවබොධනොවේ. එබැවින් එක්වරක් දෙවරක් බැලූ පමණින් කාරණය අවබොධ නුනත් නැවත නැවත බැලීමෙන් අවබොධ කරගැනීමට උත්සාහ දැරිය යුතුයි.

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා - සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං - විඤ්ඤාණපච්චයා නාමරූපං යන ස්ථාන තුන පටිච්චසමුප්පාදයේ ඉතාම ගැඹුරු ස්ථාන හැටියට සැලකිය හැක්කේය. එසේදනමුත් ඒ ස්ථාන කාටත් තේරුම්ගැනීමට හැකිවන පරිදි ඉතා ලිහිල් කොට විස්තර කරන ලදි. ප්‍රත්‍යය ක්‍රමය ගැන විස්තර කිරීමට ආරම්භ කෙළේ ඊට පසුවයි. එසේ කෙළේ අපහසුවූ කරුණු තුනක් විස්තර කරන අවස්ථාවේදීම තවත් අපහසු කරුණක් විස්තර කිරීමට ගියොත් සාමාන්‍ය ජනයාට එය ලොකු අපහසුවක් වන නිසයි. ඒ නිසා දැන් මීට ඉහත විස්තර කළ "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා- සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යන ස්ථාන දෙක පිළිබඳවද දතහගතයුතු ප්‍රත්‍යය ක්‍රමය දක්වීමට අදහස්කරමු. එයිනුදු පළමුකොට "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යන්න පිළිබඳ ප්‍රත්‍යය ක්‍රමය දක්වනු ලැබේ.

පුණ්‍යාභිසංස්කාරයන්ට අවිද්‍යාව දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වන්නේය. අපුණ්‍යාභිසංස්කාරයන්ට අනෙකප්‍රකාරයෙන් ප්‍රත්‍යය වන්නේය. ආනෙඤ්ජාභිසංස්කාරයන්ට එක් පරිද්දෙකින් ප්‍රත්‍යය වන්නේය.

එහෙයින් කීහ:—

"පච්චයො හොති පුඤ්ඤානං - දුවිධා නෙකධා පන
පරෙසං පච්ඡිමානං සා - එකධා පච්චයො මතා-"

පුණ්‍යාභිසංස්කාරයන්ට අවිද්‍යාව ප්‍රත්‍යය වන ක්‍රම දෙක නම් ආරම්මණ ප්‍රත්‍යය- උපනිස්සය ප්‍රත්‍යය යන ක්‍රම දෙකයි.

"මේ අවිද්‍යාව ක්‍ෂයවන ධර්මයක්ය. විනාශවන ධර්මයක්ය." කියා යමෙක් සිහි කෙරේනම් එකල්හි කාමාවචර කුසල සිත් උපදී. ඒ කුසල් සිත් උපදින්නේ අවිද්‍යාව අරමුණු වීමෙනි. එබැවින් එය ආරම්මණ ප්‍රත්‍යය වන බව සැලකිය යුතු.

යම් යම් චිත්තචෛතසික ධර්මයන්ට යම් යම් රූපාදි ධර්මයෝ අරමුණු ඉවත් නම් ඒ ඒ රූපාදි ධර්මයෝ ඒ ඒ චිත්ත චෛතසික ධර්මයන්ගේ ආලම්බන ප්‍රත්‍යය වසයෙන් සැලකිය යුතු වෙත්.

චක්‍ෂුර්විඥානය හෙවත් රූපදක්නාසිත හා ඒසිත සමගයෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට රූපය ආලම්බන ප්‍රත්‍යය වේ. එසේම සොත විඤ්ඤාණය හෙවත් ශබ්ද අසන සිත හා ඒ සිත සමග යෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට ශබ්දය ආලම්බන ප්‍රත්‍යය වේ. ඝාණ විඤ්ඤාණය හෙවත් ගඳ දැනගන්නා සිත හා ඒ සිත සමග යෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට ගන්ධය ආලම්බන ප්‍රත්‍යය වේ. ජිව්හා විඤ්ඤාණය හෙවත් රස දැනගන්නා සිත හා ඒ සිත සමග යෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට රසය ආලම්බන ප්‍රත්‍යය වේ. කාය විඤ්ඤාණය හෙවත් ස්පර්ශය දැනගන්නා සිත හා ඒ සිත සමග යෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට ස්පර්ශය ආලම්බන ප්‍රත්‍යය වේ.

රූපාදි අරමුණු පස ආවර්ජනා කරන පඤ්චවාරාවර්ජන චිත්තයාගේද, ඒ අරමුණු පස පිළිගන්න සම්පටිච්ඡන චිත්තයාගේද ඒ පංචවාරාවර්ජන සම්පටිච්ඡන යන සිත් සමග යෙදෙන චෛතසිකයන්ගේද ඉපදීමට ඉහතකී රූපාදි පසම ආලම්බන ප්‍රත්‍යයවේ.

රූපාදි පස සහ ධර්මය යන සය කුශලාකුශල විපාකක්‍රියාචිත්තයන් ගේ සහ ඒ සිත් සමග යෙදෙන චෛතසිකයන්ගේ ඉපදීමට ආලම්බන ප්‍රත්‍යය වේ.

යම් සේ දුර්වල පුරුෂයෙක් දණ්ඩක හෝ රැහැණක එල්ලී නැගිටීද සිටීද එසේම චිත්ත චෛතසික ධර්මයෝ රූපාදි අරමුණු වල එල්ලී උපදිත් පවතිත්. එබැවින් චිත්ත චෛතසිකයන්ට අරමුණුවූ සියලුම ධර්මයෝ ආලම්බන ප්‍රත්‍යය වසයෙන් සැලකිය යුතු වෙති. රූපාදි අරමුණු අතුරෙන් අවිද්‍යාව ධර්මාලම්බනයකි.

අභිඥා චිත්තයෙන් හෙවත් අනුන්ගේ සිත් දැන ගන්නා ඥානාදියෙන් අවිද්‍යාසහගත චිත්තය දැනගනීනම් එකල්හි රූපාවචර කුසල් සිත් උපදී. ඒ කුසල් සිත් උපදින්නේත් අවිද්‍යාව අරමුණුවීමෙනි. එබැවින් එයද ආලම්බන ප්‍රත්‍යයබව සැලකිය යුතුයි.

අවිද්‍යාව දුරුකිරීම පිණිස දන්දීම් ආදි කාමාවචර පින්කම් කරන කල්හිද, රූපාවචරධ්‍යානයන් උපදවනකල්හිද, හටගන්නාවූ කාමාවචර රූපාවචර කුසල් සිත් වලට අවිද්‍යාව **උපනිස්සය ප්‍රත්‍යය** වසයෙන් උපකාර වේ.

යමෙක් අවිද්‍යාව හෙතුකොටගෙන කාමභවය සහ රූපභවය පතා කාමාවචර-රූපාවචර කුසල් කෙරේනම් ඔහුගේද ඒ කුසල් සිත්වලට අවිද්‍යාව **උපනිස්සය ප්‍රත්‍යය** වසයෙන් උපකාරවේ. උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳ දීර්ඝවිස්තරයක් 113 වෙනි පිටේ දක්වා ඇත. ඒ නිසා තව විස්තර දැනගනු කැමැත්තන් විසින් එය බලා දැනගත යුතුයි. මෙහි දක්වන ලද්දේ පුණ්‍යාභිසංස්කාරයන්ට අවිද්‍යාව ප්‍රත්‍යයවන ක්‍රම දෙක පෙන්වීම් වසයෙන් ස්වල්ප මාත්‍රයකි.

මී ලඟට අපුණ්‍යාභිසංස්කාරයන්ට අවිද්‍යාව ප්‍රත්‍යයවන ක්‍රමය දක්වනු ලැබේ.

යම් කිසි වෙලාවක අවිද්‍යාව අරබයා රාගාදිය උපදීනම් එකල ඒ රාගාදීන්ගේ ඉපදීමට අවිද්‍යාව ආලම්බන ප්‍රත්‍යය වේ. අවිද්‍යාව අරමුණුවන බැවිනි. අවිද්‍යාව ගරු කොට ආශ්වාදනය කෙරේනම් එකල්හි ඒ රාගාදීන්ගේ ඉපදීමට අවිද්‍යාව **ආලම්බනාධිපති-ආලම්බනූපනිස්සය** යන ක්‍රමවලින් ප්‍රත්‍යයවන්නේය. අවිද්‍යාවෙන් මුළාවී සතුන් මැරීම් ආදියෙහි දොෂ නොදක සතුන් මැරීම් ආදිය කෙරේ නම් එකල්හි උපදින ප්‍රථම ජවනචිත්තයට **උපනිස්සය** වසයෙන් අවිද්‍යාව ප්‍රත්‍යය වන්නේය. නොදැනීම සත්වඝාතනාදීයට බලවත් හෙතුවක් වන බැවිනි. දෙවෙනි ජවන චිත්තාදීන්ට **අනන්තර-සමනන්තර-අනන්තරූපනිස්සය-ආසෙවන-නත්‍ථි-විගත** යන ප්‍රත්‍යය වසයෙන් උපකාර වේ.

යම් කිසි ධර්මයක් සමීපවීමෙන් අන්‍ය ධර්මයකට උපකාර වේ නම් එය **අනන්තරප්‍රත්‍යය** නමි.

රූපයක් ඇසට හමුවූ කල 1 **අතීතභවාඞ්ග චිත්තය** හෙවත් ඉක්මගිය චිත්තක්‍ෂණ ඇති භවාඞ්ගසිත ඉපිද නැති වී ගියාට පසු 2 **භවාඞ්ගචලන චිත්තය** හෙවත් භවාඞ්ගය සොලවන සිත උපදී. ඒ සිතේ ඉපදීමට උපකාරවන්නේ අතීත භවාඞ්ග චිත්තයයි. භවාඞ්ගචලනයලඟට 3 **භවඞ්ගුපච්ඡෙද චිත්තය** හෙවත් භවාඞ්ගය සිඳ බිඳ දමනසිත උපදී. ඒ සිතේඉපදීමට උපකාරවන්නේ භවාඞ්ගචලනයයි. භවඞ්ග පච්ඡෙදය ලඟට 4 **පඤ්චද්වාරාවර්ජන චිත්තය** හෙවත් රූපාදි අරමුණු පස ගැන සලකන සිත උපදී. ඒ සිතේ හටගැනීමට උපකාරවන්නේ භවඞ්ගුපච්ඡෙද චිත්තයයි. පඤ්චද්වාරාවර්ජන චිත්තය ලඟට 5 චක්ෂුර්විඥානය හෙවත් රූපය දක්නා සිත උපදී. ඒ සිතේ ඉපදීමට උපකාරවන්නේ පඤ්චද්වාරාවර්ජන චිත්ත

යයි. චක්ෂුර්විඥානය ලඟට සම්පටිච්ඡනචිත්තය හෙවත් අරමුණු පිළිගන්නා සිත උපදී. ඒ සිතේ ඉපදීමට උපකාරවන්නේ චක්ෂුර් විඥානයයි. සම්පටිච්ඡන චිත්තය ලඟට 7 සන්තීරණචිත්තය හෙවත් අරමුණු තීරණය කරන සිත උපදී. ඒ සිතේ ඉපදීමට උපකාරවන්නේ සම්පටිච්ඡන චිත්තයයි. සන්තීරණ චිත්තය ලඟට 8 වොත්ථපන චිත්තය හෙවත් අරමුණු නියම කරගන්නා සිත උපදී. ඒ සිතේ ඉපදීමට උපකාරවන්නේ සන්තීරණ චිත්ත යයි. මෙසේ ආසන්න භාවයෙන් උපකාරවීම **අනන්තර ප්‍රත්‍යය** බව සැලකිය යුතු.

මේ දක්වන ලද්දේ අව්‍යාකෘත සිත් අව්‍යාකෘත සිත්වලට අනන්තර ප්‍රත්‍යය වූ පිළිවෙළයි. කුසලුත් අකුසලුත් නොවන සිත් වලට **අව්‍යාකෘත** යයි කියති. අතීත භවාඞ්ගචිත්තයේ සිට වොත්ථ පනචිත්තය තෙක් ඒ අතරතුර පැවැති සිත් 8 **අව්‍යාකෘත** වේ. වොත්ථපන චිත්තය ලඟට 9-10-11-12-13-14-15 **ජවන්සිත්** හෙවත් අරමුණෙහි දුවන-අරමුණෙහි රසවිඳින සිත් සතක් උපදී. ඒ සිත් සත අතුරෙන් 1 වන ජවන් සිතේ ඉපදීමට උපකාර වන්නේ වොත්ථපන චිත්තයයි. එබැවින් එය අව්‍යාකෘත චිත්ත යක් අනන්තර ප්‍රත්‍යයවීමෙන් හටගත් කුශල චිත්තයක් හෝ අකු ශල චිත්තයක් වෙයි. මුලින් කී අරමුණ යහපත්වී නම් කුශල ජවනය වේ. අයහපත් වී නම් අකුසල ජවනය වේ. පළමුවෙනි ජවනය ලඟට 2-3-4-5-6-7 ජවන් සිත් උපදී. ඒ සිත් අතුරෙන් දෙවෙනි ජවනයාගේ ඉපදීමට පළමුවෙනි ජවනයද තුන්වෙනි ජවනයාගේ ඉපදීමට දෙවෙනි ජවනයද සතරවෙනි ජවනයා ගේ ඉපදීමට තුන්වෙනි ජවනයද පස්වෙනි ජවනයාගේ ඉපදීමට හතර වෙනි ජවනයද හය වෙනි ජවනයාගේ ඉපදීමට පස්වෙනි ජවනයද සත්වෙනි ජවනයාගේ ඉපදීමට සයවෙනි ජවනයද **අනන්තර ප්‍රත්‍යය** වසයෙන් උපකාර වන බව සැලකිය යුතු.

මේ දක්වන ලද ක්‍රමය කුශලචිත්තයක් අනන්තර ප්‍රත්‍යය වීමෙන් ලැබෙන කුසල චිත්තයකට හෝ අකුසල චිත්තයක් අනන්තර ප්‍රත්‍යය වීමෙන් ලැබෙන අකුසලචිත්තයකට හෝ නිදර්ශන වසයෙන් ගත හැක්කේය.

ජවන් සිත් ලඟට තදාලම්බන සිත් හෙවත් ඒ ජවන් සිත් විසින් ගන්නා ලද අරමුණෙහිම එල්ලී හටගන්නා සිත් 16-17 දෙක උපදී. ඒ සිත් දෙක අතුරෙන් පළමුවන තදාලම්බන චිත්ත යාගේ ඉපදීමට උපකාර වන්නේ සත්වෙනි ජවන චිත්තයයි.

එබැවින් එය කුශල චිත්තයක් හෝ අකුසල චිත්තයක් අනන්තර ප්‍රත්‍යය වීමෙන් හටගත් අව්‍යාකෘත චිත්තයක් ලෙස සැලකිය යුතු. තදාලම්බන සිත්ද අව්‍යාකෘත වේ. පළමුවෙනි තදාලම්බන චිත්තය ලඟට දෙවෙනි තදාලම්බන චිත්තය උපදී. ඒ දෙවෙනි තදාලම්බන චිත්තයාගේ ඉපදීමට උපකාරවන්නේ පළමුවෙනි තදාලම්බන චිත්තයයි. එබැවින් එය අව්‍යාකෘත චිත්තයක් අනන්තර ප්‍රත්‍යය වීමෙන් හටගත් අව්‍යාකෘත චිත්තයක් ලෙස සැලකිය යුතු.

මෙසේ සලකා බලනවිට අනන්තරප්‍රත්‍යය වීමේදී ඒ ඒ සිත් ක්‍රම ක්‍රිපයකට යෙදෙන බව පෙනේ.

අවිද්‍යාවෙන් මුලාවූ සතුන් මැරීම් ආදියෙහි දෙස් නොදක්නා තැනැත්තෙකු සතුන් මැරීම් ආදිය කරන කල හටගත් පළමුවෙනි ජවනය දෙවෙනි ජවනයට අනන්තරප්‍රත්‍යය වන්නේ අකුසල් වසයෙනි. දෙවෙනි ජවනාදිය තුන්වෙනි ජවනාදියට උපකාර වන්නේත් ඒ ක්‍රමයෙන් මය.

ඉහත කී පරිදි සතුන් මැරීම් ආදිය කරන කල දෙවෙනි ජවනාදියට ප්‍රථම ජවනය සමනන්තරප්‍රත්‍යය වසයෙන්ද උපකාර වේ.

අනන්තර ප්‍රත්‍යයට වඩා සමනන්තර ප්‍රත්‍යයෙහි අදහස් වසයෙන් වෙනසක් නැත්තේය. එබැවින් ඒ ගැන යමක් මෙහි නොලියමු. ඉහතකී පරිදි සතුන් මැරීම් ආදිය කරන්නාවූ පුද්ගලයාට උපදින්නාවූ ප්‍රථම ජවනාදියට ද්විතීය ජවනාදිය අනන්තරූප නිස්සය - ආසෙවන - නත්ථි - විගත ප්‍රත්‍යය වසයෙන්ද උපකාර වන්නේය. මෙකී ප්‍රත්‍යයන් අතුරෙන් අනන්තරූපනිස්සය ප්‍රත්‍යය මීට ඉහත විස්තර කරනලදී එබැවින් මෙහිදී ඒ ගැන විස්තර කරනු නොලැබේ.

බලවත් පුරුද්ද නිසා උපකාරවීම ආසෙවන ප්‍රත්‍යය නම්. යමෙකු ඉගෙනගන්නා කල මුලින් මුලින් ඉගෙනගත් පොත් පසු පසුව ඉගෙනගන්නා පොත්වලට උපකාර වේ. මුලින් මුලින් ඉගෙනගත් ශිල්පය පසු පසුව ඉගෙනගන්නා ශිල්පයට උපකාර වේ. එසේම මුලින් මුලින් ඉපදුන කුසල ජවන පසු පසුව උපදින කුසල ජවනවලටද, මුලින් මුලින් ඉපදුන අකුසල ජවන පසු පසුව උපදින අකුසල් ජවනවලටද, මුලින් මුලින් ඉපදුන ක්‍රියා ජවන පසු පසුව උපදින ක්‍රියාජවනවලටද ආසෙවන වසයෙන් ප්‍රත්‍යය වනබව සැලකිය යුතුයි.

යමෙකුගේ අභාවය යමෙකුගේ ඇතිවීමට උපකාර වේනම් **එය නාස්ති ප්‍රත්‍යය** නම්. මහරජතුමාගේ නැතිවීම සවකීය පුත්‍රයාගේ රාජ්‍යප්‍රාප්තියට උපකාර වෙයි. ප්‍රධාන සභාපතිතුමාගේ නැතිවීම උපසභාපතිතුමාගේ ප්‍රධානසභාපතිභාවයට උපකාරවෙයි.

එසේම පළමු පළමු හටගත් චිත්තචෛතසිකයන්ගේ සිදී බිඳීයාම පසු පසුව හටගන්නා චිත්තචෛතසිකයන්ගේ ඇතිවීමට උපකාර වෙති. අවිද්‍යාව නිසා හටගන්නා ප්‍රථම ජවනයන්ගේ නැතිවී යෑම ද්විතීය ජවනයන්ගේ ඇතිවීමට උපකාර වන්නේ ඒ ක්‍රමයෙනි.

විගතප්‍රත්‍යයද නාස්තිප්‍රත්‍යය මෙනි.

යම්කිසි අකුසලයක් කරන පුද්ගලයාට **හෙතු- සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- සම්පයුත්ත - අත්ථි- අවිගත-** යන ප්‍රත්‍යය වසයෙන්ද අවිද්‍යාව උපකාර වන්නේය. යම්කිසි ධර්මයක ස්ථිරව පැවැත්මට යම්කිසි ධර්මයක් උපකාර වේනම් එය **හෙතු ප්‍රත්‍යය** නම්.

ගසේ පැවතීමට මූල ආධාර වේ. අලොභ-අද්වෙෂ- අමොහ- ලොභ- ද්වෙෂ- මොහ- යන හෙතු ධර්මයෝ ඒ හෙතුධර්ම හා එකට යෙදුණු චිත්තචෛතසික ධර්මයන්ගේ ස්ථිරව පැවැත්මට උපකාර වෙති. එසේම යම්කිසි අකුසලයක් කරන පුද්ගලයාට අවිද්‍යාව **හෙතු** වසයෙන්ද උපකාර වේ. අඤ්ඤමඤ්ඤප්‍රත්‍යයාදිය මීට ඉහත විස්තර කරන ලදී.

මීලඟට විස්තර කළයුත්තේ සංසකාරයන් විඤ්ඤාණයට උපකාරවන ක්‍රමයි. **කර්ම ප්‍රත්‍යය- උපනිස්සය ප්‍රත්‍යය** යන ක්‍රම දෙකින් සංසකාරයෝ විඤ්ඤාණයට උපකාර වෙත්.

එකී කර්ම- උපනිස්සය යන ප්‍රත්‍යය දෙකද මීට ඉහත විස්තර කරන ලද බැවින් මෙහිදී යමක් නොලියමු.

දැන් අවිද්‍යාව සංසකාරයන්ටත්, සංස්කාර විඤ්ඤාණයන්ටත්, විඤ්ඤාණය නාම රූප දෙකටත් උපකාරවන ක්‍රම සම්පූර්ණය. එබැවින් එකී ක්‍රම ගැන හොඳින් සිතට ගෙන ඒ ඒ තැන්වල අදහස පිරිසිදුලෙස වටහාගැනීමට උත්සාහ දැරියයුතු.

# නිවේදනය.

කාලය දුර්භාග්‍යය. ආර්ථික තත්ත්වය කිසිසේත් සතුටුදායක නොවේ. එහෙත් ජේ. ජේ. ප්‍රණාන්දු මහතාගේ විතරණ ගුණය නොසැලිණ. එබැවින් පටිච්චසමුප්පාදයේ සිංහල භාවය පිළිබඳ පස්වෙනි කාණ්ඩයද බෞද්ධ මහා ජනයා අත තබන්ට ලැබිණ. මෙය ප්‍රකාශයට පැමිණවිය යුතුව තිබුණේ පසුගිය වර්ෂයේය. අපගේ අනවකාශත්වය ඊට බාධාවිය. ජේ. ජේ. ප්‍රණාන්දු මහතාගේ උදාසීනභාවයකින් නොවේ. ඒ මහත්මෝ නම් අපට මේ ගැන නිතර නිතර සිහිකරවති.

මේ වර මේ කාණ්ඩය ලියුවේ යම්තම් විද්‍යාලයේ විවේක කාලය ලැබීමෙන් පසු වය ඒ සුළු කාලය තුළද තව නොයෙක් කටයුතු වලට මුහුණ පාන්ට සිදුවිය. එබැවින් අදහස් කරගෙන සිටි පරිදි පෝර්ම් අටකින් යුක්තව ප්‍රසිද්ධ කරවීමට නොහැකි විය.

අපගේ ශිෂ්‍ය මාදුපිටියේ මේධානන්ද තැන මෙහි ශෝධ්‍ය පත්‍ර බලාදීම් ආදියෙන් බොහෝ සිහිටවිය.

සෞගතාධාර සභාවේ උප සභාපතිවරයෙක් වූ මිල්ලෙනිය වතුයායේ භාරකාර තැන්පත් වලාණේ ජේ. ජේ. ප්‍රණාන්දු මහතාණෝ ස්වකීය ප්‍රියාම්බිකාවට පින් අනුමෝදන් කරනු වස් මෙය කරගෙන යති. එය අතිශයින් පැසසියයුත්තකි. දෙලෝ වැඩ සලසා දෙන්නකි.

මෙහි විස්තර කරන ධර්මකාණ්ඩ කාටත් ප්‍රයෝජනය. එබැවින් මෙය හොඳින් කියවාබලා තේරුම් ගැනීමෙන් දෙලෝ වැඩ සාදා ගැනීමට සියල්ලන් උත්සාහ දැරිය යුතු.

මීට,

ශාසනස්ථිතිකාමී

වලාණේ ශ්‍රී විජයානන්ද ස්ථවිර,
Walane Wijayananda.
විද්‍යාලයාධිපති.

ශ්‍රී විජය සෞගත විද්‍යාලය,
වලාණ-පානදුරේ.
13-5 2482/1938